ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

වාර්ෂික වාර්තාව

සහ

ගිණුම් ප්‍රකාශය

2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දක්වා

ගරු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා,
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය,
කොළඹ 05.

ගරු ඇමතිතුමනි,

<u>වාර්ෂික වාර්තාව - 2011</u>

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2011 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය වෙනුවෙන් පහත සඳහන් ලේඛන ඇතුළත් සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

1. 2011 ජනවාරි මස 01 වන දින සිට 2011 දෙසැම්බර් 31 වන දින දක්වා වූ වර්ෂය සඳහා සංස්ථාවේ පාලන වාර්තාව.
2. 2011 ජනවාරි මස 01 දින සිට 2011 දෙසැම්බර් 31 වන දින දක්වා වූ වර්ෂය සඳහා සංස්ථාවේ ගිණුම් ප්‍රකාශය.
3. 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව.
4. විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාව ඉදිරිපත් කරන පරිකථනය.

මෙයට - විශ්වාසී

හඩ්සන් සමරසිංහ
සභාපති
ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
කොළඹ 07.

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

දැක්ම

ප්‍රමුඛ ශ්‍රී ලාංකික ගුවන්විදුලි සන්නිවේදකයා වීම.

මෙහෙවර

ශ්‍රාවකයන්ගේ ජීවිතයට බලපාන ආර්ථික, සමාජයීය, සංස්කෘතික, සදාචාරාත්මක, අධ්‍යාපනික, විනෝදාත්මක යනාදී විවිධ ක්ෂේත්‍ර ඇසුරෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය වඩාත් උසස් මට්ටමකට ගෙන ඒමත් ඔවුන්ගේ ජීවිත ආලෝකවත් කිරීමත් උදෙසා, දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනයට සමත් වන ආකාරයෙන් ගුවන්විදුලි මාධ්‍යය මෙහෙයවීම.

අරමුණු

1. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුන සඳහා වැඩිම ශ්‍රාවක පිරිසක් සහිත ගුවන්විදුලි නාලිකා පවත්වාගෙන යන ආයතනය ලෙස කටයුතු කිරීම.
2. වගකීමෙන් යුතුව සමබර තොරතුරු කඩිනමින් ලබාදෙන, ශ්‍රී ලාංකික මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස කටයුතු කිරීම.
3. දේශීය සංස්කෘතියේ අභිවෘද්ධිය පිණිස උසස් සහ නිර්මාණාත්මක වැඩසටහන් නිෂ්පාදනය කර ඉදිරිපත් කිරීම.
4. දැනුම, ආකල්ප සහ කුසලතාවන්ගෙන් පිරිපුන් ස්වයං අභිප්‍රේරිත කාර්ය මණ්ඩලයක් බිහි කිරීමට අවශ්‍ය පුහුණුව ලබා දීම.
5. නිෂ්පාදන සහ විකාශන තාක්ෂණය නිසි පරිදි යාවත්කාලීන කරමින් දෙස් විදෙස් ශ්‍රාවකයන්ට පැහැදිලි ශ්‍රවණ තත්ත්වයක් ලබාදීම.
6. ආචාරධර්ම පද්ධතියකට අනුව හරවත් ගුවන්විදුලි මාධ්‍ය සම්ප්‍රදායක් බිහි කිරීම උදෙසා පුරෝගාමී ආයතනය ලෙස ක්‍රියා කිරීම.
7. ජාතික ගුවන්විදුලිය ලෙස රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම සඳහා නිර්මාණශීලී මාධ්‍ය දායකත්වය සැපයීම.
8. යහපත් මූල්‍ය පාලනයක් හා මානව සම්පත් කළමනාකාරීත්වයක් පවත්වාගෙන යාම.
9. තරගකාරී වෙළඳපොල උපායශීලීව ජය ගැනීම.

පාලන වාර්තාව – 2011

පාලන වාර්තාව - 2011

හැඳින්වීම

2011 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට 2011 දෙසැම්බර් මස 31 දින දක්වා මාස 12 ක කාල සීමාවක් සඳහා මෙම වාර්තාව ඉදිරිපත් කරන අතර, අදාල කාලය තුළ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

1. හඩ්සන් සමරසිංහ මහතා - සභාපති
2. ආචාර්ය හරිශ්චන්ද්‍ර විජේතුංග - සාමාජික
3. කුමාරදාස සපුතන්ත්‍රි මහතා - සාමාජික
4. මනෝජ් පීරිස් මහතා - සාමාජික
5. දර්ශනා සේනානායක මහත්මිය - භාණ්ඩාගාර නියෝජිත

පාලන වාර්තාව

ශ්‍රී ලාංකික ගුවන්විදුලි ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස කටයුතු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව 2011 වර්ෂයේ ජාතික නාලිකා 7 ක්, ප්‍රාදේශීය සේවා 6 ක්, ප්‍රජා ගුවන් විදුලි 2 ක් සමග විකාශන කටයුතු සිදු කර තිබේ. ශ්‍රාවකයන්ගේ ජීවිතයට බලපාන ආර්ථික, සමාජයීය, සංස්කෘතික, සදාචාරාත්මක, අධ්‍යාපනික හා විනෝදාත්මක යන ක්ෂේත්‍ර ඇසුරෙන් ශ්‍රාවකයාගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මෙහෙවරයි. 2011 වර්ෂය දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය කිරීමෙන් ජාතික මෙහෙවරක නියැලීම ප්‍රමුඛ කොටගත් වසරකි.

භාෂා 4 කින් විදේශ සේවා පවත්වාගෙන යමින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ජාත්‍යන්තර ශ්‍රාවකයන්ගේ හද දිනා ගැනීමට සමත්වී ඇත.

සිංහල ස්වදේශීය සේවය, දෙමළ ස්වදේශීය සේවය, සිංහල වෙළඳ සේවය, සිටි.එෆ්.එම්. සේවය තෙන්ඩ්‍රල් , ඉංග්‍රීසි සේවය, හින්දි සේවය, මැද පෙරදිග සේවය, විදුල, ටයිම් රේඩියෝ, සංගීත අංශය, ක්‍රීඩා අංශය, ආගමික අංශය, ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් ඒකකය සහ ජනාධිපති ඒකකය යන අංශ සංස්ථාවේ මෙහෙවර ඉටුකිරීම සඳහා සංස්කෘතික, දේශපාලනික හා ආගමික වශයෙන් ජාතික අනන්‍යතාව තහවුරු කරමින් වැඩසටහන් නිර්මාණය කර තිබේ. පාලන, මධ්‍යම ක්‍රියාකාරී, මුදල්, ප්‍රවාහන, විගණන, පිළිගැනීමේ, අලෙවි සහ පුහුණු අංශ ගුවන්විදුලියේ වැඩසටහන් උපකාරක සේවා ලෙස ක්‍රියාත්මක වෙයි.

2011 සමාලෝචිත වර්ෂයේ ස්වදේශීය සේවය සිය ජාතික මෙහෙවර ඉටුකිරීම සඳහා ධර්ම දේශනා සහ වෙනත් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇත. ඉසිවර අසපුව, දිරියට සවියක්, සන්ධ්‍යා සේවය, සිත නිවන බුදු බණ, සුභාරතී, ගොවිතැනට පැයක් සහ ඉන්ටර්නෙට් සම්පත් භාවිතය යන වැඩසටහන් ඒ අතර ප්‍රමුඛ ඒවාය.

තරු අතරට තරුවක්, උරුම රකිමු, දැය සුරකිමු, පැහැබර ළමා ලොවක්, ලක්ෂපතියෝ, වනන්තරේ කතන්දරේ, අඬහැරය, නේත්‍ර පූජා, මෙත් කරුණා, මුවන් පැලැස්ස, රුවන් ලඳක්, සුවබර දිවියක් වැනි වැඩසටහන් වෙළඳ සේවයේ ගුවන් කාල අලෙවි කළ වැඩසටහන්ය.

සිටි.එෆ්.එම්. සේවය සහ සිංහල වෙළඳ සේවය ඒකාබද්ධව සංවිධාන කළ "තරු අතරට තරුවක්" විද්වත් වෘත්තිකයන්ගේ සහභාගිත්වයෙන් පැවති සංගීතමය වැඩසටහන 2011 වසරේ ජනප්‍රියතම ප්‍රවර්ධන වැඩසටහනක් විය. ඒ තුලින් වෘත්තිමය ක්ෂේත්‍රයේ ඉහළම තලයන්හි නියුක්ත වුවන්ගේ හැකියාවන් එළිදැක්වීමටත්, මෙම නාලිකාවලට ප්‍රබුද්ධ ශ්‍රාවක පිරිසක් සම්බන්ධ කරගැනීමටත් අවකාශ සැලසුණි.

දෙමළ ස්වදේශීය සේවයේ විඩියුම් වෙලායි, කවිතා කලාසම්, මුත්තමල්ආරම්, පෙන් උලගම්, සිරුව මලර්, සහ නාට්‍ය වැඩසටහන් ජනප්‍රසාදය දිනාගත් අතර, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විශේෂිත දිනයන් සමරමින් දෙමළ ස්වදේශීය සේවයේ වැඩසටහන් විකාශය කර තිබේ.

ලාංකික වාණිජ ගුවන්විදුලි ක්ෂේත්‍රයේ පුරෝගාමී මෙහෙවර ඉටු කිරීමේ අරමුණින් වෙළඳ සේවය වෙළඳ වැඩසටහන් සඳහා ප්‍රමුඛත්වය ලබාදීමටත්, සේවාදායකයන් සඳහා නව ආකෘති හඳුන්වා දීමටත්, වෙළඳ දැන්වීම් ප්‍රචාරයට වැඩි ඉඩකඩක් ලබා දීමත්, සමාලෝචිත වර්ෂය තුළ කටයුතු කර ඇත. මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් ඇගයීමේ උපහාර වැඩසටහන් අතර ප්‍රවීන ගුවන්විදුලි විකට වැඩසටහන් ශිල්පී බර්ටි ගුණතිලක මහතාගේ උපහාර උළෙල 2011 වර්ෂයේ ක්‍රියාකාරකම් අතර විශේෂයෙන් වැදගත් විය.

විදුල ළමා ගුවන්විදුලිය සහ අධ්‍යාපන සේවය, ස්වදේශීය සේවය හා ඒකාබද්ධ වෙමින් දිනපතා ප.ව. 2.00 සිට 6.00 දක්වා ගුවන් කාලය ළමයින් වෙනුවෙන් වැඩසටහන් ඉදිරිපත් කර තිබේ.

තෙන්ඩ්‍රල් විකාශයේ පෙ. ව. 7.00 සිට 9.00 දක්වා ගුවන් කාලයේ කාලීනව වැදගත් තොරතුරු හා ප්‍රවෘත්ති වටිනාකම් සහිත සහිත තොරතුරු අන්තර්ගත විය. එමෙන්ම මෙම සේවය ජාතික හා ජාත්‍යන්තර තොරතුරු හා විශේෂිත සිදුවීම් අළලා 2011 වසරේ විශේෂ වැඩසටහන් නිෂ්පාදනය කර ඇත. ජාත්‍යන්තර කාන්තා දිනය, ලෝක සෞඛ්‍ය දිනය, සාම දිනය, වැඩිහිටි දිනය හා ලෝක ළමා දිනය, ගුරු දිනය, ලෝක ඒඩ්ස් දිනය ඒ අතර ප්‍රධාන වේ. රාමසාන්, තෛපොංගල්, ජාතික දිනය, ශිව රාත්‍රී පූජා, හජ්ජි, දීපවාලී, නත්තල් දින විශේෂිත වැඩසටහන්, තෙන්ඩ්‍රල් ඔස්සේ ගුවන් ගැනින. යෞවනය සඳහා සංගීත වැඩසටහන ඒ අතර ප්‍රධානවේ.

ඉංග්‍රීසි සේවය පසුගිය වසරේ මෙන් 2011 වසර තුළ ද විශේෂිත දින හා විශේෂිත පුද්ගලයන් අරමුණු කොට ගනිමින් සතිඅන්ත වැඩසටහන් සහ දෛනික වැඩසටහන් නිෂ්පාදනය කර තිබේ. 2011 සිට 2016 දක්වා රජයේ ක්‍රියාත්මක කිරිමට බලාපොරාත්තු වන වැඩ පිළිවෙළ අරමුණු කරගනිමින් විශේෂ වැඩසටහන් ඉදිරිපත් කර ඇති අතර, අසන්නන්ගේ විනෝදාස්වාදය සඳහා සංගීතමය වැඩසටහන් රැසක් ද දෛනිකව නිෂ්පාදනය කර ඇත. නත්තල් වැඩසටහන්, සංගීත

කණ්ඩායම් හඳුන්වාදීමේ වැඩසටහන්, යුද හමුදා, නාවුක හමුදා, ගුවන් හමුදා වාදක කණ්ඩායම් සහභාගි වූ වැඩසටහන් සහ ගීත පෙළ ගැස්වීම් (Chart show) 2011 වසරේ ඉංග්‍රිසි සේවය ක්‍රියාත්මක කර තිබේ.

මුස්ලිම් සේවය ඔස්සේ සේවාදායක වැඩසටහන් ලෙස තෙලිව්, අපේ පාසල, කෙටි කථා, උර්වාලම්, නබි මොලිගල්, නූර්විහම්, නූරුල්ඉක්ලාම්, මන්ජරි වැනි වැඩසටහන් නම් කළ හැකිය.

සංස්ථා ක්‍රීඩා අංශයට, අන්තර් සාමාජීය ප්‍රිමියලීග් තරගාවලිය, බටහිර ඉන්දීය කොදෙව් සහ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම් අතර එක්දින ක්‍රිකට් තරගය, අන්තර් පාසල් වාර්ෂික ක්‍රිකට් තරගාවලි, IPL ක්‍රිකට් තරගාවලිය, ශ්‍රී ලංකාව හා එංගලන්තය අතර ක්‍රිකට් තරගය, 2014 පාපන්දු ලෝක කුසලාන, කැල්ටෙක්ස් බේබි කෙයා, මහවැලි ක්‍රීඩා, ඕස්ට්‍රේලියාව හා ශ්‍රී ලංකාව අතර ක්‍රිකට් තරගය, ගජබා සුපර්ක්‍රොස් තරගය, ශ්‍රී ලංකාව හා පාකිස්තානය අතර සාජාහි පැවැති තරගය, ශ්‍රී ලංකා-අප්‍රිකා ක්‍රිකට් තරගය, දකුණු ආසියා ප්‍රථම පෙළ තරගය ආදී ජාතික වැදගත්කමකින් යුත් ක්‍රිඩා තරග රැසක් සේවාදායකත්වය යටතේ විකාශ කිරිමේ හැකියාව ලැබිණ.

සිටි එෆ්. එම්. සේවය ඔස්සේ ධීවර රේඩියෝව "සයුර" නමින් මධ්‍යම රාත්‍රී 12.00 සිට පසුදා අළුයම. 04.00 දක්වා ගුවන් විදුලි විකාශයක් සේවාදායකත්වයක් සහිතව සජීවීව ඉදිරිපත් කරයි. පොහොය දින හා ජාතික වශයෙන් හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් දින වෙනුවෙන් සුවිශේෂ වැඩසටහන් රැසක් මෙම සේවය විකාශය කර තිබේ. ශ්‍රාවක රස වින්දනය අරමුණු කරගනිමින් සරල ගී ශිල්පීන්ට ජාතික ගුවන්විදුලිය අත්වැල් සපයන වැඩසටහනක් ලෙස "සුභාවිත ගීතය" ඉමහත් ශ්‍රාවක ප්‍රතිචාර ලබා ඇත.

ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් අංශය දිනකට ප්‍රවෘත්ති විකාශ 40 ක් භාෂාත්‍රයෙන්ම විකාශය කරයි. 2011 වසරේ පුවත් සැනෙළිය හා ප්‍රවෘත්ති අටුවාව අලුතින් හඳුන්වාදුන් වැඩසටහන් වේ.
"SLBC News'' නමින් මොබිටෙල් ආයතනය හා ඒකාබද්ධව කෙටි පණිවිඩ සේවාවක් 2011 වසරේ ආරම්භ කෙරිණ. නිවැරදි හා සත්‍ය තොරතුරු වගකීමකින් යුතුව රාජ්‍ය ප්‍රතිපත්තියට අනුගතව ඉදිරිපත් කිරීම ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් අංශයේ අරමුණයි.

අතිගරු ජනාධිපතිතුමා සහභාගි වූ සහ වෙනත් විශේෂ අවස්ථා සඳහා මාධ්‍ය ආවරණය ලබාදීම සංස්ථාවේ ජනාධිපති ඒකකයේ විශේෂ කාර්ය භාරය විය. එතුමන් සහභාගි වූ එක්සත් ජාතීන් ගේ 66 වන සමුළුව පිළිබඳ තත්ත්ව වාර්තා ලබාදීම, නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය විවෘත කිරීම, දක්ෂිණ ලංකා අධිවේගී මාර්ගය විවෘත කිරීමේ උත්සවය සහ නෙලුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහල විවෘත කිරීම වැනි උත්සව අවස්ථා සඳහා අවශ්‍ය මාධ්‍ය ආවරණය ලබාදීම මෙහිදී විශේෂයෙන් සඳහන් කළ හැකිය.

අලෙවි අංශය 2011 වසරේ රුඃ 31,619,836.00 ක ආදායමක් අලෙවි කටයුතුවලින් උපයාගෙන තිබේ. මෙය පසුගිය වසරට වඩා රු. 5,117,578.00 ක වැඩිවීමකි.

ශ්‍රවණ පර්යේෂණ අංශය 2011 වසර සඳහා ශ්‍රවණ තත්ත්වය පිළිබඳ සමීක්ෂණය කර ඇති අතර, සමස්ත සේවාවල ශ්‍රවණ තත්ත්වය දුර්වල බවත් ඒවා කඩිනමින් යථා තත්ත්වයට පත්විය යුතු බවත් වාර්තා කොට ඇත. සෑම සිංහල සේවාවකටම අදාලව වැඩසටහන් ඇගයීමේ කටයුතු විමර්ශනික වර්ෂයේ සිදු කොට තිබේ.

අභ්‍යාස ආයතනය සංස්ථාවේ මානව සම්පත් සංවර්ධනය උදෙසා වැඩසටහන් 17 ක් ක්‍රියාත්මක කර තිබේ. ඉන් 15 ක් දීර්ඝ කාලීන වැඩසටහන් විය. බාහිර අභ්‍යාසලාභීන් සඳහා පාඨමාලා 7 ක් ද පුහුණු අංශය ක්‍රියාත්මක කර තිබේ. ඒවා ආදායම් උපයන පාඨමාලා වූ අතර එමගින් ගුවන් විදුලි අභ්‍යාස ආයතනයට ලැබුණු මුළු ආදායම රු: 2,250,850.00 කි.

ඉංජිනේරු අංශය ගතවූ වර්ෂය තුළ සංස්ථාවේ විකාශන පද්ධතිය ප්‍රශස්තව පවත්වාගැනීම සහ සංස්ථාවේ අනෙකුත් තාක්ෂණික කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. ප්‍රධාන කාර්යාලය සඳහා ටොන් 5 ක ධාරිතාවයෙන් යුත් නව වායු සමීකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම, ඉංග්‍රීසි වෙළඳ සේවය සඳහා ස්වයංක්‍රිය පරිගණක පද්ධතියක් හඳුන්වා දීම (Automation), යාපනය ප්‍රාදේශීය සේවාව සඳහා නව මැදිරි සංකීර්ණයක් ඉදි කිරීම, සංස්ථාව සතු ගීත අන්තර්ජාලය හරහා ගෙවීම් ක්‍රමයක් මත බාගත කර ගැනීම සඳහා පහසුකම් සැලැස්වීම, අනිවත්ත සේවක නිල නිවාස සහ අඹේවෙල සංචාරක බංගලාවේ අළුත්වැඩියා කටයුතු, මැදිරි යන්ත්‍රෝපකරණ යාවත්කාලීන කිරීම, සංස්ථාවේ පරිගණක ඒකකය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම, ආනන්ද සමරකෝන් මැදිරිය සඳහා චැනල් 48 ක හඬ මිශ්‍රණයක් සිදු කළ හැකි නව මිශ්‍රකයක් ස්ථාපනය කිරීම, 10වන පටිගත කිරීමේ මැදිරිය සඳහා සංගීත වැඩසටහන් පටිගත කිරීමට නව තාක්ෂණික උපකරණ සවි කිරීම ප්‍රධාන ව්‍යාපෘති අතරින් සමහරකි.

ගිණුම් ප්‍රකාශය – 2011

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

2011-12-31 දිනට ශේෂපත්‍රය

වත්කම්	සටහන		2011-12-31 රු.		2010-12-31 රු.
ජංගම නොවන වත්කම්					
දේපොල පිරියත සහ උපකරණ	**8**		**823,519,652**		**837,078,001**
නොනිමි ප්‍රාග්ධන		9,148,693			
සී/ස. ලංකා පුවත් සමාගමේ ආයෝජනය	**9**	1,000,000	**10,148,693**	1,000,000	**1,000,000**
ජංගම වත්කම්					
තොග පරිභෝජනය	**10**		29,111,669		26,757,117
ණය ගැතියෝ - ගුවන් කාල විකුණුම්		168,681,587		196,203,459	
(බොල් ණය සඳහා ප්‍රතිපාදන)		(70,091,476)	98,590,111	(58,186,429)	138,017,030
සේවක ණය, අත්තිකාරම් සහ මාර්ගස්ථ තොග	**11**		33,105,549		41,128,538
විවිධ ණය ගැතියෝ	**12**		**37,031,571**		**45,091,131**
වෙනත් තැන්පතු			9,847,582		9,422,582
අතැති මුදල්, බැංකු ශේෂය සහ ඒක්ෂණ තැන්පතු	**13**		145,935,186		94,344,635
			353,621,668		**354,761,033**
මුළු වත්කම්			**1,187,290,012**		**1,192,839,033**
ස්කන්ධ හා වගකිම්					
ප්‍රාග්ධනය හා සංචිත					
ප්‍රාග්ධනය		307,386,085		307,386,085	
ප්‍රාග්ධන සංචිත		3,900,003		3,900,003	
ප්‍රත්‍යාගණන සංචිතය		14,421,999		14,421,999	
අය භාර සංචිතය		49,415,938	375,124,025	13,001,061	338,709,148
			375,124,025		**338,709,148**
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	**14**	151,574,555		154,469,646	
විලම්බිත ආදායම (ජපන් ආධාර)	**15**	102,461,821		109,213,811	
රජයේ ප්‍රධාන	**16**	242,646,076		248,767,202	
කල්බදු (මෝටර් රථ)	**17**	39,835,192		16,671,355	529,122,014
			536,517,644		**529,122,014**
ජංගම වගකීම්					
ණය හිමියෝ - ගුවන් කාල විකුණුම්	**18**	85,768,444		124,497,945	
විවිධ තැන්පතු (ආපසු ගෙවිය යුතු)		10,166,348		9,575,202	
කල්බදු (මෝටර් රථ)	**17**	10,722,324		4,496,426	
උපචිතයන්, අත්තිකාරම් හා විවිධ ණයහිමයෝ	**19**	168,991,227		186,438,298	
					325,007,871
			275,648,343		**325,007,871**
මුළු ස්කන්ධ හා වගකිම් වල එකතුව			**1,187,290,012**		**1,192,839,033**

අත්සන් කළේ

හඩ්සන් සමරසිංහ	**කුමාරදාස සපුතන්ත්‍රි**	**එච්.ඒ.යු. ජයලත්**
සභාපති	සංස්ථා මණ්ඩල සාමාජික,	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මුදල්),
ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව.	ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව.	ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව.

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

2011-12-31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

	සටහන්	31.12.2011 රු.		31.12.2010 රු.	
ආදායම	**1**		550,961,883		504,636,711
එකතු කළා					
වෙනත් මෙහෙයුම් ආදායම්	**2**		305,834,543		319,085,118
දළ ආදායම			**856,796,426**		**823,721,829**
අඩු කළා					
බෙදාහැරීමේ පිරිවැය	**3**	68,643,211		56,560,161	
පරිපාලන වියදම්	**4**	444,285,521		443,392,433	
මෙහෙයුම් වියදම්	**5**	302,056,195		275,986,153	
			814,984,927		775,938,748
මූල්‍ය පිරිවැයට පෙර ලාභය (අලාභය)			**41,811,499**		**47,783,081**
අඩු කළා					
මූල්‍ය පිරිවැය	**6**	5,396,622	5,396,622	9,762,213	9,762,213
බදුවලට පෙර ලාභය (අලාභය)			**36,414,877**		**38,020,868**
බදු					
බදුවලට පසු ලාභය (අලාභය)			**36,414,877**		**38,020,869**
පෙර වර්ෂයේ ඉ/ගෙ. ශේෂය			13,001,061		(25,019,808)
ඉදිරියට ගෙනගිය ශේෂය			**49,415,938**		**13,001,061**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		2011		2010
මෙහෙයුම් ක්‍රියාවලියෙන් ජනනය වූ මුදල් ප්‍රවාහය				
පොළී හා බදුවලට පෙර ශුද්ධ ලාභය (අලාභය)		**36,414,877**		**38,020,869**
ගැලපීම්				
නිවහන සහ අනෙකුත් ආදායම් සඳහා වෙන්කිරීම්				
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම	(90,443,516)		(93,452,441)	
විනිමය අනුපාතයේ බලපෑම			(117,752)	
ක්ෂය වීම	79,385,878		77,949,423	
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	6,071,359		3,566,675	
බොල් ණය සඳහා ප්‍රතිපාදන	12,055,788		2,446,712	
වත්කම් අපහරණයෙන් සිදුවන ලාභය/පාඩුව			(2,343,665)	
කල්බදු පොලිය	3,436,439		3,335,651	
ආර්ථික සේවා ගාස්තු සඳහා ප්‍රතිපාදන	6,513,529	**17,019,478**	5,779,257	**(2,836,140)**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය				
වෙනත් තැන්පතුවල අඩුවීම/වැඩිවීම	(425,000)		(1,715,666)	
තොගවල අඩුවීම/වැඩිවීම	(2,354,552)		60,353,671	
ණය ගැතියන්ගේ අඩුවීම/වැඩිවීම	27,371,130		(13,907,014)	
සේවක ණය අත්තිකාරම් මාර්ගස්ථ තොග අඩුවීම/වැඩිවීම	8,022,990		1,139,175	
විවිධ ණයගැතියන්ගේ අඩුවීම/වැඩිවීම	8,059,560		(5,826,541)	
විවිධ ණයහිමියො අඩුවීම/වැඩිවීම	(38,729,501)		7,250,552	
විවිධ තැන්පතු (ආපසු ගෙවියයුතු) අඩුවීම/වැඩිවීම	591,146		4,810,233	
උපචිතයන්, අත්තිකාරම් සහ විවිධ අඩුවීම/වැඩිවීම	(23,960,601)	**(21,424,828)**	10,477,924	**62,582,334**
		32,009,527		**97,767,063**
පාරිතෝෂික ගෙවීම	(8,966,450)		(22,849,690)	
ආර්ථික සේවා ගාස්තු			(2,405,681)	
		(8,966,450)		(25,255,371)
මෙහෙයුම් කාර්යමය ශුද්ධ මුදල		**23,043,077**		**72,511,692**
ආයෝජන කාර්යයන්ගෙන් ජනනය වූ මුදල් ප්‍රවාහය				
රජයේ ප්‍රදාන	77,570,400		100,000,000	
වත්කම් විකුණුම්	-		2,343,665	
දේපළ , පිරියත හා යන්ත්‍රසූත්‍ර මිලදී ගැනීම	(28,577,529)		(131,739,965)	
කල්බදු වාරික ගෙවීම	(11,296,704)		(7,072,842)	
නොනිමි ප්‍රාග්ධන කාර්යයන්	(9,148,693)			
ආයෝජන කාර්යයන් සඳහා වැය කළ ශුද්ධ මුදල		**28,547,474**		**(36,469,142)**
මුල්‍ය කාර්යයන්ගෙන් ජණනය වූ මුදල් ප්‍රවාහය				
ටී.ඩබ්.ආර්. ණය ආපසු ගෙවීම	-		(3,193,908)	
මුල්‍ය කාර්යයමය ශුද්ධ මුදල		**-**		**(3,193,908)**
මුදල් හෝ මුදල් හා සම්බන්ධ විෂයයන්ගේ ශුද්ධ අඩුවීම / වැඩිවීම		**51,590,551**		**32,848,642**
කාල පරිච්ඡේදය ආරම්භයේදී වූ මුදල් හෝ මුදල් සමාන විෂයයන්		**94,344,635**		**61,495,993**
කාල පරිච්ඡේදය අවසානයේදී වූ මුදල් හෝ මුදල් සමාන විෂයයන්		**145,935,186**		**94,344,635**

<u>ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශය</u>

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.**	**ප්‍රාග්ධන සංචිත රු.**	**ප්‍රත්‍යාගණන සංචිත රු.**	**සමුච්ත ලාභය /පාඩුව රු.**	**ස්කන්ධ එකතුව රු.**
2010 ජනවාරි 01 දිනට ශේෂය	307,386,085	3,900,003		(25,019,808)	286,266,280
					-
වර්ෂය සඳහා ලාභය/පාඩුව				38,020,869	38,020,869
2010-12-31 දිනට ශේෂය	307,386,085	3,900,003	14,421,999	13,001,061	338,709,148
වර්ෂය සඳහා ලාභය/පාඩුව				36,414,877	36,414,877
					-
2011-12-31 දිනට ශේෂය	**307,386,085**	**3,900,003**	**14,421,999**	**49,415,938**	**375,124,025**

2011 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂයේ ගිණුම් ප්‍රකාශනය සඳහා සටහන්

01. අදාල සංස්ථා තොරතුරු

1.1 පොදු

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව 1966 අංක 37 දරණ පාර්ලිමේන්තු පනත යටතේ ප්‍රතිෂ්ඨාපනය කරන ලද සංස්ථාවකි. කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ එහි ප්‍රධාන කාර්යාලය හා මූලික ව්‍යාපාර ස්ථානය පවත්වාගෙන යනු ලැබේ.

1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම් ස්වභාවය

අදාල වර්ෂය තුළ ගුවන් කාලය විකිණීම සංස්ථාවේ ප්‍රධාන කාර්යය වේ.

1.3 ප්‍රකාශන අනුමැතිය ලබාගත් දිනය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ගිණුම් ප්‍රකාශනය නිකුත් කිරීම සඳහා 2012 අප්‍රේල් 05 වන දින බලය ලබාගෙන ඇත.

1.4 සේවක සංඛ්‍යාව

වර්ෂය අවසානයේ ස්ථිර සේවක සංඛ්‍යාව 821 ක් වූ අතර කොන්ත්‍රාත් සේවක
සංඛ්‍යාව 33 ක් විය.
(2010-12-31 දිනට - 861)

02. ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ අදාල සාරාංශය

2.1 පොදු ප්‍රතිපත්ති
පිළියෙල කිරීමේ පදනම

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ගිණුම් පිළිබඳ ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම් ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් පිළියෙල කරනු ලැබුවේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවය.
මෙම මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය සංකල්පය පදනම් කරගෙන ශ්‍රී ලංකා රුපියල් වලින් සකස් කර ඇත.

2.2 සැසඳුම් තොරතුරු

පසුගිය වර්ෂයේදී සංස්ථාව විසින් යොදා ගත් ගිණුම් ප්‍රතිපත්ති මේ වසරේද ඒ අයුරින්ම යොදාගෙන ඇති අතර, මෙම වර්ෂයේ ඉදිරිපත් කිරීම්වලට අනුකූල වන සේ සංඛ්‍යා සහ වගන්ති සකස් කරන ලදි.

2.3 විදේශ විනිමය ගනුදෙනු

විදේශ විනිමය සම්බන්ධ ගනුදෙනුව එම ගනුදෙනුව ක්‍රියාත්මක වූ අවස්ථාවේ පැවති විනිමය අනුපාත මත රුපියල්වලට පරිවර්තනය කරන ලදි. ශේෂ පත්‍ර දිනට තිබූ විදේශ විනිමයෙන් දක්වන ලද සියලුම වත්කම් හා බැරකම් එදින පැවති විනිමය අනුපාත මත පරිවර්තනය කර ඇත. එවැනි ගනුදෙනු වලින් ජනිත වූ ලාභ හෝ අලාභ පිළිබඳ කටයුතු කරන ලද ආකාරය ආදායම් ප්‍රකාශයේ සඳහන් කර ඇත.

2.4 බදුකරණය

අ වර්තමාන බදු

2000 වර්ෂයේ අංක 38 දරණ දේශීය ආදායම් බදු පනත හා අංක 3 සංශෝධනයට අනුකූලව ගණනය කරන ලද ආදායම හා වියදම් අනුව බදු ගෙවීම සඳහා ප්‍රතිපාදන මූල්‍ය වාර්තාවල පෙන්නුම් කර තිබේ. සංස්ථාවේ ආදායමෙන් උපයන ලාභයෙන් 35% ක බදු ගෙවීම කළ යුතුව ඇත.

ආ විලම්බිත බදුකරණය

විලම්බිත බදුකරණය වගකීමේ ක්‍රමය මත ඉදිරිපත් කර ඇත. මුල්‍ය ප්‍රකාශනවල සඳහන් ක්‍රියාත්මක බදු අනුපාත මත ගණනය කර ඇති විලම්බිත බදු කාල පරිච්ඡේදයක් තුළ විවිධ ස්වරූපයෙන්, ආදායම් බදු සඳහා වෙන් කරනු ලබන සියලු භාණ්ඩවල තාවකාලික වෙනස්වීම් සඳහා බලපායි.

ප්‍රයෝජනයට ගතහැකි ඉදිරියට ගෙන ආ අසාමාන්‍ය බදු අලාභ සහ සියලු අඩු කළ හැකි තාවකාලික වෙනස්වීම් වලට එරෙහිව සිදුවිය හැකි බදු ලාභයේ ප්‍රමාණයට ඉදිරියට ගෙන ආ අසාමාන්‍ය බදු අලාභය සහ සියලු අඩු කළ හැකි තාවකාලික වෙනස්වීම් සඳහා විලම්බිත බදු වත්කම් හඳුනාගෙන ඇත.

ඉදිරියට ගෙන ආ විලම්බිත බදු වත්කම් අගය සෑම ශේෂ පත්‍ර දිනකම සමාලෝචනය කර ප්‍රයෝජනයට ගැනීමට ඇති විලම්බිත බදු සඳහා ප්‍රමාණවත් බදු වත්කම් පවත්වා ගන්නා තවදුරටත් ලාභයක් නොවන බදු වත්කම් පළමු වෙන් කිරීම් වලින් අඩු කරනු ලබයි.

2.5 ශේෂ පත්‍ර දිනට පසුව වූ සිද්ධීන්

ශේෂ පත්‍ර දිනට පසුව සියලු සිද්ධි සලකා බලන ලද අතර ඒවාට උචිත ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මුල්‍ය ප්‍රකාශ වලින් දක්වා ඇත.

2.6 ණය පිරිවැය

ණය පිරිවැය අදාළ කාලය තුළ දරණ ලද වියදම් ලෙස සලකනු ලැබේ.

2.7 වට්ටෝරු භාණ්ඩ

ක්ෂය කල හැකි වට්ටෝරු භාණ්ඩ සඳහා ගැණුම් මිල සටහන් කර ඇත. අභාවිත, සදොස් සහ සෙමෙන් චලනය වන වට්ටෝරු භාණ්ඩ සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.

03. වත්කම් තක්සේරු කිරීම සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

3.1 දේපොල පිරියත සහ උපකරණ

දේපොල පිරියත සහ උපකරණ පිරිවැයෙන්, සමුච්චිත ක්ෂය අඩු කර දක්වා ඇත. වත්කම් ක්‍රියාකාරී තත්ත්වයට ගෙනඒමට හෝ ඒවායින් බලාපොරොත්තු වන ප්‍රයෝජන ලබාගැනීමට සිදු කළ කවර ආකාර වියදමක් හෝ මිලදී ගැනීම් සඳහා දරණ ලද පිරිවැය දේපළ, පිරියත සහ උපකරණ පිරිවැය වේ.
අනාගත ආර්ථික ප්‍රතිලාභ වර්ධනය කරන දේපොල, පිරියත සහ උපකරන පිරිවැය පමණක් ප්‍රාග්ධනීකරණය කර ඇත. අනෙකුත් සියලු වියදම් ආදායමට ගලපන ලදි. ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් ප්‍රත්‍යාගණන සංචිතයක් ලෙස ශේෂ පත්‍රයේ ප්‍රාග්ධන සංචිතයක් ලෙස ඇතුලත් කළ හැකි වන්නේ මීට පෙර එකී වත්කමේ අගය අඩු වීම, ලාභය හෝ අලාභ ලෙස හඳුනාගෙන ඇති විට පමණි.
වත්කම අගය ප්‍රත්‍යාගණන කර එහි වෙනස ඍජුව හෝ ඊට පෙර එකී වත්කමේ අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයේ අතිරික්තයට ගැලපූ අවස්ථාවක හැර, ප්‍රත්‍යාගණන වෙනස ලාභයක් හෝ අලාභයක් ලෙස සලකනු ලැබේ.

3.2 ක්ෂය

සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලබන අතර ක්ෂය අනුපාතයන් පහත පරිදිවේ.

නම	ක්ෂය අනුපාත
ගොඩනැගිලි	2.5%
පිරියත සහ උපකරන	7.5%
සංගීත භාණ්ඩ	10%
මෝටර් රථ	25%
ලී බඩු සවි කිරීම් හා උපකරණ	10%
තැටි හා පටි	33.33%
ශ්‍රව්‍ය සංඛ්‍යාත උපකරන	7.5%
සම්ප්‍රේෂක	7.5%
පරිගණක උපකරණ	50%
සුළු මෙවලම්	50%

වත්කම්වල සුන්බුන් අගය එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය හා ක්ෂය කිරීමේ ක්‍රමය විමර්ශනය කර, එකල වත්කම්වල අගය වැඩිවී ඇතිනම් එය මූල්‍ය වර්ෂයේ අවසානයේදී ගලපනු ලැබේ.

3.3 (අ) කල්බදු

මූල්‍ය කල්බදු

සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සහිත කල්බදු අයිතිය පසුව සංස්ථාවට පැවරෙන කල්බදු දේපොල, පිරියත සහ උපකරණ ඒවායේ මූල්‍ය වටිනාකමට දේපොල, පිරියත සහ උපකරණ යටතේ ප්‍රාග්ධනිත කරනු ලබන අතර එකී වත්කම් පාවිච්චි කිරීමේදී සංස්ථාව ප්‍රතිලාභ ලබා ගැනීමට අපේක්ෂිත ආකාරයට ක්ෂය කරනු ලැබේ.

කල්බදු හිමියාට ගෙවනු ලබන මූලික ගෙවීම් බැරකම් ලෙස පෙන්වනු ලැබේ. හිඟව පවතින බැරකම් ශේෂයට අදාළ පොලී ප්‍රමාණය ලබා ගැනීම සඳහා කල්බදු ගෙවීම්වලට අදාල මූල්‍ය ගාස්තු සහ කල්බදු බැරකම් අඩුවීම අතර බෙදා හරිනු ඇත. කල්බදු කාලසීමාවට අදාලව ගෙවිය යුතු පොලී ප්‍රමාණය, පොලී අවිනිශ්චිත ගිණුමට මාරු කරන අතර මුදල් වර්ෂයට අනුරූපී පොලී කොටස කල්බදු උපයෝජනය කරන කාලය තුළදී සංඛ්‍යාත ක්‍රමය පදනම් කර ගනිමින් ආදායම් ප්‍රකාශයට අය කරනු ලැබේ.

කල්බදු දේපොල වැඩි දියුණු කිරිම පිරිවැය ප්‍රාග්ධනිත කිරීම කල්බදුකරණයේ වැඩිදියුණු කිරීම් හෙළිදරව් කිරීම සහ හායනය නොවන කාළයට වැඩි කල්බදු හෝ ඇස්තමේන්තුගත සඵල ජීවිත කාලයේ වැඩිදියුණු කිරීම් වලින් අඩු අගය මත ක්ෂය කර ඇත.

3.4 වෙළඳ සහ වෙනත් ලැබීම්

ණයගැතියෝ සහ වෙනත් ලැබීම්, බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන වලින් වූ උපලබ්ධි අගය මත ඇස්තමේන්තු කර දක්වා ඇත.

3.5 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය භාවිතා කර පිළියෙල කර ඇත. අතැති මුදල්, බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු සහ කෙටිකාලීන ඉහල ද්‍රවශීලී ආයෝජන මුදල් සහ මුදල් සමාන දෑ ලෙස අර්ථ දක්වා තිබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් සහ මුදල් සමාන දෑ ලෙස සඳහන් කර ඇත්තේ අතැති මුදල්, බැංකු තැන්පතු සහ නොපිය වූ බැංකු අයිරා ය.

04. වගකීම් සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍ර දින සිට වර්ෂයක් තුළ ඉල්ලුම් කිරීමේදී ගෙවිය යුතු ලෙසට සලකන ලද වගකීම් ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙසට විග්‍රහ කර ඇත. ශේෂ පත්‍ර දිනට වර්ෂයකට පසුව ගෙවීමට තුඩු දිය හැකි විෂයයන් දිගුකාලීන වගකීම් ලෙසට වර්ගීකරණය කර ඇත.

4.1 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ පිරිවැය මත සඳහන් කර ඇත.

4.2 ප්‍රාග්ධන වගකීම් සහ අසම්භාව්‍යයන්

සංස්ථාවේ ප්‍රාග්ධන වගකීම් සහ අසම්භාව්‍යයන් පිළිබඳව, ගිණුම් සමග වූ ඒ ඒ සටහන් මගින් හෙළිදරව් කිරීම් කර ඇත.

4.3 විශ්‍රාම පාරිතෝෂික වගකීම්

4.3.1 පාරිතෝෂික සැලසුම් අර්ථකථනය - විශ්‍රාම පාරිතෝෂික

පාරිතෝෂිකය යනු අර්ථ දක්වන ලද ප්‍රතිලාභ සැලසුමක් වේ. අදාල පනතට අනුව පාරිතෝෂික ගෙවීම සඳහා සංස්ථාව නෛතිකව බැඳී ඇත. මෙම වගකීම් සපුරාලීම සඳහා ගිණුම් ප්‍රමිත 16 - හි සඳහන් සූත්‍රය අනුව ගණනය කරන ලද ප්‍රතිපාදන ශේෂපත්‍රයේ පහළට ගෙනැවිත් ඇත. වසර මුලදී ඉදිරියට ගෙන ආ ප්‍රතිපාදන සහ කරන ලද ශුද්ධ ගෙවීම් ප්‍රමාණය අතර වෙනස පහළට ගෙනගිය ප්‍රතිපාදන, වසර අවසානයේ දී ආදායම් ප්‍රකාශනයේ දක්වනු ලැබේ.

වට්ටම් ප්‍රතිශතය	11.00%
බලාපොරොත්තු වැටුප් වර්ධක ප්‍රතිශතය	5.00%
සේවක පිරිවැටුප් අනුපාතය	1.00%

වගකීම් සඳහා බාහිර අරමුදල් ලබාගැනීමක් සිදුව නැත. එම අයිතම ශේෂ පත්‍රයේ ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇත.

4.3.2 අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාරත්ව අරමුදල් දායකත්වය

අදාල නීති සහ රෙගුලාසි වලට අනුව සේවකයින් සේවක ආර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාරත්ව අරමුදල් දායකත්වයට සුදුසුකම් ලබයි. ඒ අනුව සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාරත්ව අරමුදලට සේවක දළ වැටුපෙන් 15% සහ 3% සංස්ථාව දායක කරයි.

4.3.3 රජයේ ප්‍රදාන

මූල්‍ය ප්‍රකාශනයේ ආදායම් යටතේ හඳුනාගෙන ඇති රජයේ ප්‍රදාන මූලිකව ශේෂ පත්‍රයේ ජංගම නොවන වගකීම් සහ විලම්භිත ආදායම් යටතේ පෙන්වා ඇත. ප්‍රදාන වලට අදාලව කළ ගෙවීම් සඳහා වන හිමිකම් සහ ප්‍රයෝජනයට නොගත් ප්‍රමාණ ශේෂ පත්‍රයේ පෙන්වා ඇත.

දේපළ, පිරියත සහ උපකරණ සඳහා ලැබෙන ප්‍රධාන ආදායමට ගැලපිය යුතු අතර ඒවා හීනවන ශේෂ ක්‍රමයට ලියා හළ යුතුය.

නම	ක්ෂය අනුපාත
ගොඩනැගිලි	2.5%
පිරියත සහ උපකරන	7.5%
මෝටර් රථ	25%
ලී බඩු සවි කිරීම් හා උපකරණ	10%
තැටි හා පටි	33.33%
ශ්‍රව්‍ය සංඛ්‍යාත උපකරන	7.5%
සම්ප්‍රේෂක	7.5%

05. ආදායම් ප්‍රකාශනය

5.1 ආදායම් සහ වියදම්

5.1.1 පිරිවැටුම

සංස්ථාවේ පිරිවැටුම ගුවන් කාලය අලෙවියේ ඉන්වොයිසි අගය මත ඉදිරිපත් කර ඇත.

5.1.2 ආදායම් හඳුනාගැනීම

ස්ථිරව ගණනය කළ හැකි ආදායම සහ සංස්ථාවට ලැබීමට ඇති ආර්ථික වාසි ප්‍රමාණය ආදායම ලෙස හඳුනාගෙන ඇත.
දේපොල, පිරියත සහ උපකරණ ඉවත් කිරීමේදී ගණනය කරනු ලබන ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශනයට ගලපනු ලැබේ.
පොලී ආදායම උපචිත පදනම මත හඳුනාගෙන ඇත.
වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත

5.1.3 වියදම් හඳුනා ගැනීම

ආදායම් ප්‍රකාශනයේ වියදම් හඳුනාගෙන ඇත්තේ විශේෂිත ආදායම් අයිතමයන්හි උපයාගැනීම් සහ දරණ ලද පිරිවැය අතර සෘජු සංඝටන පදනම මතය.

1 වර්ෂය සඳහා ලාභය හෝ පාඩුව ගණනය කිරීමේදී ව්‍යාපාරය පවත්වා ගැනීම සඳහා සහ සංස්ථාවේ දේපල, පිරියත සහ උපකරණ නඩත්තු කිරීම සඳහා දරණ ලද සියලු වියදම් ආදායමට ගළපන ලදි.

2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාවේ කාර්යක්ෂමතාව පිළිබිඹු වන ආකාරයේ මිනුම්දණ්ඩක් ලෙස වියදම් ක්‍රම තෝරාගෙන ඇති අතර, එම ක්‍රම මූල්‍ය ප්‍රකාශනයන්හි ගලපා ඇත.

	නම	තනතුර	සම්බන්ධ පාර්ශ්වය ගනුදෙනු
1	හඩ්සන් සමරසිංහ මහතා	සභාපති	නැත
2	ආචාර්ය හරිශ්චන්ද්‍ර විජේතුංග මහතා	සංස්ථා මණ්ඩල සාමාජික	නැත
3	කුමාරදාස සපුතන්ත්‍රී මහතා	සංස්ථා මණ්ඩල සාමාජික	නැත
4	මනෝජ් පීරිස් මහතා	සංස්ථා මණ්ඩල සාමාජික	නැත
5	දර්ශනා සේනානායක මිය	භාණ්ඩාගාර නියෝජිත	නැත
6	සමන්ත වැලිවේරිය මහතා	අධ්‍යක්ෂ ජනරාල්	නැත
7	ජ්‍යරානන්ද හෙට්ටිආරච්චි මහතා	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	නැත

මූල්‍ය ප්‍රකාශනයේ සටහන්

1. ආදායම්

	2011	2010
ගුවන් කාල විකුණුම් (ආසියා සේවය)	21,019,372	31,560,998
ගුවන් කාල විකුණුම් (ටී.ඩබ්.ආර්.)	108,358,419	114,901,933
ගුවන් කාල විකුණුම් (දේශිය සේවා)	362,623,878	309,676,854
නිෂ්පාදන ගාස්තු (දේශිය සේවා)	4,326,631	4,051,097
අවමංගල්‍ය දැන්වීම්	5,150,847	5,635,647
ගුවන් කාල විකුණුම් (බිබිසි)	19,799,800	22,945,756
ගුවන් කාල විකුණුම් (එෆ්.ඊ.බී.ඒ.)	2,783,599	1,618,728
ගුවන් කාල විකුණුම් (ෆැමිලි රේඩියෝ)	26,899,336	14,083,197
සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් පාඨමාලා ගාස්තු		162,500
	550,961,883	**504,636,711**

2. වෙනත් ආදායම්

	2011	2010
සංස්ථා ප්‍රකාශන අලෙවිය	186,278	56,039
පොලී ආදායම	4,390,808	3,436,783
විවිධ ආදායම් (වෙනත්)	43,185,345	25,059,337
අගරු වූ චෙක්පත් සඳහා ප්‍රතිචාරක නියෝජිතයන්ගේ දඩ මුදල්	35,647	22,950
නිවාස කුලී	6,100	6,310
නුවරඑළිය නිවහන හා අඹේවෙල නිවාඩු නිකේතන සඳහා ආදායම්	821,463	702,168
විශේෂිත පටිගත කිරිම්	228,575	169,194
"රේඩියෝ ඩොයිෂවෙල" බදු කුලිය සහ සේවා ගාස්තු	32,939,172	31,719,960
බලපත්‍ර සඳහා ප්‍රමාද ගාස්තු	39,375	1,954
ගුවන්විදුලි යන්ත්‍ර ආනයනකරුවන්, වෙළෙන්දන්, එකලස්කරුවන්, අළුත්වැඩියා කරන්නන්ගේ බලපත්‍ර ගාස්තු	5,272,545	2,048,525
කැසට් අලෙවිය	13,273,234	10,046,408
දඩ ගිණුම	12,487	19,384
ගුවන්විදුලි බලපත්‍ර සඳහා රජයේ ප්‍රදාන	115,000,000	150,000,000
ඉඩම් විකුණුම්		2,343,665
රජයේ සහ ජපාන ආධාර සඳහා ක්‍රමක්ෂය	90,443,516	93,452,441
	305,834,543	**319,085,118**

2.1 ගුවන්විදුලි බලපත්‍ර අහෝසි කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 115 ක මුදල් ප්‍රදානයක් රජයෙන් ලැබී ඇත.

3. බෙදාහැරීමේ වියදම්

	2011	2010
ගුවන් කාල විකුණුම් කොමිස් (දේශිය)	48,059,774	44,028,961
ගුවන් කාල විකුණුම් කොමිස් (විදේශිය)	2,710,307	4,539,790
හදිසි උප ලේඛන ගාස්තු	27,000	31,625
බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන	12,055,788	2,446,712
කර්තෘභාග වියදම්	2,193,550	(230,720)
ව්‍යාපාර ප්‍රවර්ධන වියදම්	3,596,792	5,743,792
	68,643,211	**56,560,161**

4. පරිපාලන වියදම්

	2011	2010
දීමනා - සභාපති සහ සංස්ථා සාමාජිකයින්	660,000	570,000
වැටුප්, වේතන හා දීමනා	293,820,836	291,910,275
සේ.අ.අ. සහ සේ.නි.භා. අරමුදල් දායකය	51,392,952	51,208,540
කාර්ය මණ්ඩල අතිකාල දීමනා	18,468,549	17,229,266
සහන සේවක ගෙවීම්	47,299,762	45,921,218
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයේ පාරිශ්‍රමිකය	4,344,670	4,368,448
කාර්ය මණ්ඩල පුහුණු කිරීම් (දේශිය)	65,000	1,073,825
ගමන් වියදම් සහ යැපීම් දීමනා (දේශිය හා විදේශිය)	2,156,871	1,615,040
නිවාඩු දින ගෙවීම්	2,719,072	3,599,764
පාරිතෝෂික ගෙවීම්	6,071,359	3,566,675
සංග්‍රහ වියදම් - සභාපති	450,525	410,521
සංග්‍රහ වියදම් - අධ්‍යක්ෂ ජනරාල්	174,221	152,156
සුභසාධක	2,363,039	3,696,177
වෛද්‍ය සේවා	344,243	298,227
පොදු වියදම්	3,445,350	3,975,253
කුලී, වරිපනම් හා බදු	6,187,604	5,280,673
රක්ෂණ	562,051	1,683,579
විගණක ගාස්තු	500,000	600,000
නෛතික ගාස්තු	2,760,998	2,524,978
වාර ප්‍රකාශන හා සඟරා	459,635	561,342
පාරිතෝෂික හා නෛතික ක්‍රියාමාර්ග හා වෙනත් කටයුතු සඳහා දඩ	38,783	3,146,478
	444,285,521	**443,392,433**

4.1 2011 වර්ෂය තුළ සංස්ථා සේවක සේවිකාවන්ගේ හා ඔවුන්ගේ ඥාතීන්ගේ අවමංගල්‍ය දැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා ගුවන් කාලය වෙනුවෙන් රුː 1,063,962.00 ක පිරිවැයක් සංස්ථාව දරා ඇත. එම දැන්වීම් නොමිලේ ප්‍රචාරය කරන ලද්දේ අනුමත වී ඇති ප්‍රතිපත්තියක් මතය. මෙය සංස්ථාව සෑම වර්ෂයකදීම අනුගමනය කරනු ලබන ක්‍රියා පිළිවෙතකි.

4.2 විභාග වන නඩු

2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවට එරෙහිව අධිකරණයේ නඩු 10 ක් විභාග වෙමින් පවතී.

සංස්ථාව රුපියල් 10,000,000/- ක් අදාල පොලිය පැමිණිලිකරුට ගෙවීමට කොළඹ දිස්ත්‍රික් උසාවියේ නඩු අංක ː 23089/ එම්.ආර්. යටතේ ලබාදුන් නඩු තීන්දුව පිළිබඳව අභියාචනය ද ඇතුලත්ව නඩු තුනක් අභියාචනාධිකරණයේ විභාගවේ.

සේවය නැවත පිහිටුවීම, වේතන ලබා ගැනීම සහ වන්දි ගෙවීම සම්බන්ධ නඩු 03ක් කම්කරු විනිශ්චය සභාවේ විභාග වේ.

කම්කරු දෙපාර්තමේන්තුව බේරුම්කරණ නඩු 2 ක් විභාග වෙමින් පවතින අතර, මහේස්ත්‍රාත් අධිකරණයේ එක් නඩුවක් විභාග වෙමින් පවතී.

5. වෙනත් මෙහෙයුම් පිරිවැය

	2011	2010
වැඩසටහන් වියදම	5,249,348	4,154,828
භාහිර ගුවන්විදුලි සංවිධානවලට දායකය	482,496	478,296
ප්‍රවෘත්ති සේවා සහ ප්‍රවාත්ති සාරාංශය	1,382,395	1,225,953
දැන්වීම් සහ ප්‍රචාරණය	763,932	6,901,399
විදුලි බලය සහ බල ශක්ති	129,729,088	105,460,213
තැපැල්, විදුලි පණිවුඩ හා දුරකථන (i) සිට (ii)	9,294,402	10,625,152
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	5,715,345	5,124,905
මොටර් රථ ධාවන වියදම්	9,448,491	8,905,074
ගුවන්විදුලි උපකරණ අලුත්වැඩියා සහ නඩත්තු	7,819,275	14,084,933
සංගීත භාණ්ඩ අලුත්වැඩියා සහ නඩත්තු	228,565	24,878
ලීබඩු සවිකිරිම් අලුත්වැඩියා සහ නඩත්තු	911,375	603,619
ගොඩනැගිලි සහ ගෙවතු අලුත්වැඩියා හා නඩත්තු	17,961,832	7,282,015
ක්ෂය වීම්	79,385,878	77,949,423
පෞද්ගලික ආරක්ෂක සේවා	119,000	169,000
කැසට් වියදම්	2,578,493	1,647,381
කුලී වාහන ගාස්තු	17,712,537	22,901,863
චන්ද්‍රිකා තාක්ෂණ කුලී	6,468,860	2,500,000
ආර්ථික සේවා ගාස්තු	6,513,529	5,779,257
මුද්දර බදු	97,476	167,966
ගුවන්විදුලි සංඛ්‍යාත ගාස්තු	193,878	
	302,056,195	**275,986,153**

6. මූල්‍ය පිරිවැය

	2011	2010
බැංකු ගාස්තු	550,728	619,607
බැංකු අයිරා පොලී	1,271,393	5,847,394
හර බදු	7,698	34,176
විනිමය ලාභ (පාඩු)	76,127	(117,752)
ණය පත්‍ර කොමිස්	54,238	43,137
කල්බදු පොලිය	3,436,439	3,335,651
	5,396,622	9,762,213

7. ආදායම් බදු වියදම්

	2011	2010
මුල්‍ය ලාභය / පාඩුව	**36,414,877**	**38,020,869**
එකතු කළා		
අඩු කළ නොහැකි අයිතම		
ක්ෂය	79,385,878	77,949,423
බොල් ණය සඳහා ප්‍රතිපාදන	12,055,788	2,446,712
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	6,071,359	3,566,675
සංග්‍රහ වියදම්	624,746	562,677
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය	(90,443,516)	(93,452,441)
ආර්ථික සේවා ගාස්තු	6,513,529	5,779,257
නිවහන ආදායම සහ අනෙකුත් ප්‍රතිදාන		
	14,207,784	**(3,147,697)**
අඩු කළා		
ඉඩදිය හැකි වියදම්		
ප්‍රාග්ධන දීමනා	69,330,240	60,841,480
කල්බදු කුලී	11,296,704	7,072,842
පාරිතෝෂික ගෙවීම්	8,966,450	22,849,690
රජයේ ප්‍රදාන	115,000,000	150,000,000
	204,593,394	**240,764,012**
බදුමය ලාභය/පාඩුව	**(153,970,733)**	**(205,890,840)**
ඉදිරියට ගෙන ආ බදු පාඩුව	2,033,659,405	2,239,550,245
ඉදිරියට ගෙන ආ සම්පූර්ණ බදු පාඩුව	**2,187,630,138**	**2,033,659,405**

ආදයම් ඔස්සේ උපයාගත් ලාභයෙන් 35% ක් බදු වශයෙන් ගෙවීමට සංස්ථාව නෛතිකව බැඳී සිටී. කෙසේ වුවද සංස්ථාවේ නැවත සකසන ලද බදු පාඩුව පිළිබඳ සලකා ආදායම් බදු සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොමැත.

8.

8.1 දේපල පිරියත හා උපකරණ

ඉදිරියට ගෙන ආ දළ ශේෂය පිරිවැය මත	2011. 01. 01 දිනට ශේෂය රු.	එකතු කිරීම් රු.	ඉවත් කිරීම්/ මාරු කිරීම් රු.	2011. 12. 31 දිනට ශේෂය රු.
ඉඩම්	7,713,229	51,006		7,764,234
ගොඩනැගිලි	166,255,546	1,773,929		168,029,475
පිරියත සහ යන්ත්‍රෝපකරන	564,073,238	6,879,092		570,952,330
සංගීත උපකරණ	6,673,090	150,350		6,823,440
මෝටර් රථ	11,416,000	882,000		12,298,000
ලී බඩු, සවිකිරීම් හා කාර්යාල උපකරණ	126,346,117	3,232,528		129,578,645
තැටි සහ පටි	24,513,921	16,110		24,530,031
ශ්‍රව්‍ය සංඛ්‍යාත	843,632,752	12,312,365		855,945,117
සම්ප්‍රේෂක	1,267,232,187	313,154		1,267,545,341
පරිගණක උපකරණ	24,053,195	2,945,599		26,998,794
පුස්තකාල පොත්	428,815	5,518		434,333
මෙවලම්	91,555	15,880		107,435
	3,042,429,645	**28,577,529**	**-**	**3,071,007,174**
8.2 **කල්බදු මත ලබාගත් වත්කම්**				
මෝටර් රථ	**26,996,999**	37,250,000		64,247,000
	26,996,999	**37,250,000**		**64,247,000**
එකතුව	**3,069,426,644**	**65,827,529**	**-**	**3,135,254,174**

8.3

ක්ෂය	2011.01.01 දිනට ශේෂය රු.	අදාල කාලපරිච්ඡේදය සඳහා ක්ෂය ගෙවීම් රු.	ඉවත් කිරීම්/ මාරු කිරීම් රු.	2011.01.01 දිනට ශේෂය රු.
ගොඩනැගිලි	100,478,646	3,774,616		104,253,262
පිරියත සහ යන්ත්‍ර	454,885,236	5,614,484		460,499,720
සංගීත උපකරණ	6,457,490	59,418		6,516,908
මෝටර් රථ	4,498,312	14,345,687		18,843,999
ලී බඩු, සවි කිරීම් සහ කාර්යාල උපකරණ	84,403,487	7,754,469		92,157,956
පටි සහ තැටි	24,477,058	29,731		24,506,789
ශ්‍රව්‍ය සංඛ්‍යාත	662,583,847	17,563,725		680,147,572
සම්ප්‍රේෂක	875,220,636	25,714,596		900,935,232
පරිගණක උපකරණ	19,266,333	4,516,745		23,783,078
මෙවලම්	77,599	12,406		90,006
එකතුව	**2,232,348,644**	**79,385,878**	**-**	**2,311,734,522**

8.4

ශුද්ධ පොත් අගය **පිරිවැය මත**	**2011** රු.	**2010** රු.
ඉඩම්	7,764,234	7,713,229
ගොඩනැගිලි	63,776,213	65,776,900
පිරියත සහ යන්ත්‍ර	110,452,610	109,188,002
සංගීත උපකරන	306,532	215,600
මෝටර් රථ	57,701,001	33,914,688
ලී බඩු, සවි කිරීම් සහ කාර්යාල උපකරණ	37,420,688	41,942,630
පටි සහ තැටි	23,242	36,863
ශ්‍රව්‍ය සංඛ්‍යාත	175,797,546	181,048,905
සම්ප්‍රේෂක	366,610,109	392011551
පරිගණක උපකරණ	3,215,715	4786862
මෙවලම්	17,429	13,956
පුස්තකාල පොත්	434,333	428,815
එකතුව	823,519,652	837,078,001

9. සීමා සහිත ලංකාපුවත් සමාගමේ රුපියල් මිලියනයක් ආයෝජනය කර ඇත.

10. වට්ටෝරු භාණ්ඩ

	2011	**2010**
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල උපකරණ	424,038	392,374
ගුවන්විදුලි සහ විදුලි ආම්පන්න	687,162	228,952
මෝටර් රථ අමතරකොටස්	664,307	735,235
පොදු අමතර කොටස්	2,064,070	1,776,415
වට්ටෝරු භාණ්ඩ සහ තොග පාලන ගිණුම	6,124,608	6,215,155
ඩීසල් සහ බලය	1,796,966	705,128
කැසට් සහ සීඩී	7,353,807	6,707,148
උප ගබඩා ඒකල	9,996,710	9,996,710
	29,111,669	**26,757,117**

11. සේවක ණය, අත්තිකාරම් සහ මාර්ගස්ථ භාණ්ඩ

	2011	2010
මාර්ගස්ථ භාණ්ඩ	3,418,863	12,768,174
සේවක ණය	7,110,048	7,967,217
සේවක වෙනත් අත්තිකාරම්	17,348,663	15,741,171
සේවක ණයගැතියො (සේ. අ. අ.)	336,863	347,181
පූර්ව ගෙවීම්/ අත්තිකාරම්	34,441	259,661
සැපයුම්කරුවන්ට අත්තිකාරම්	4,851,670	4,045,134
වැටුප් හා වේතන අත්තිකාරම් ගිණුම	5,000	
	33,105,549	**41,128,538**

12. විවිධ ණයගැති

	2011	2010
විවිධ ණයගතියෝ	600,707	11,662,464
අඟරු චෙක්පත්	3,313,119	3,088,437
ජංගම ගිණුම (තැපැල්පති - අවමංගල්‍ය දැන්වීම්	7,937,460	7,936,123
අවමංගල්‍යාධාර ගිණුම		91,690
ලක්හඬ සමඟ ශාඛා ගිණුම	12,807,862	12,807,862
භාණ්ඩ හා සේවා බදු පාලන ගිණුම	237,267	109,575
රඳවාගැනීම් බදු	(8,767)	(124,962)
තැපැල්පති ජංගම ගිණුම (ගුවන්විදුලි බලපත්‍ර ගාස්තු)	195,700	195,700
අවිනිශ්චිත ගිණුම	221,965	221,965
අවිනිශ්චිත ගිණුම (සරප්)	281,110	111,808
අවිනිශ්චිත ගිණුම (අ.වි.- අසාම්)	5,713,250	5,713,250
වන්දි ගෙවීම් සඳහා අත්තිකාරම්	350,000	350,000
විලම්භිත ආදායම්	5,381,898	2,927,219
	37,031,571	**45,091,131**

13. මුදල් හා බැංකු ශේෂ

	2011	2010
ලංකා බැංකුව - මාතර	32,971	642,329
මහජන බැංකුව - ජාත්‍යන්තර ශාඛාව	19,752,934	8,619,388
ඉන්දීය රාජ්‍ය බැංකුව	391,678	3,434,090
ලංකා බැංකුව - අනුරාධපුර	-	426,449
ලංකා බැංකුව - මහනුවර	329,470	1,131,992
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව	5,065,546	1,892,810
ලංකා බැංකුව - ටොරින්ටන් -307	7,578,136	1,724,483
ලංකා බැංකුව- ටොරින්ටන් -316	478,197	120,695
මුදල් අග්‍රිමය	633,565	607,055
ලංකා බැංකුව -ටොරින්ටන් - 339	10,091,277	190,479
ලංකා බැංකුව - මදුරාසි	76,896	76,896
කොමර්ෂල් බැංකුව - ඩුප්ලිකේෂන් පාර		254,129
ලංකා බැංකුව - කෝමලේ		215,908
ඉතිරි කිරීමේ බැංකු ගිණුම (ලංකා බැංකුව) ටොරින්ටන්	75,841	72,872
ලංකා බැංකුව - ටොරින්ටන් - 014 (සැනසුම)	322,147	350,443
තීරු ගිණුම (මහජන බැංකුව)	2,704,188	2,704,188
ස්ථාවර තැන්පතු	90,730,336	81,242,200
ලංකා බැංකුව - යාල්දේවි		2,557
	145,935,186	**94,344,635**

14. විශ්‍රාම පාරිතෝෂික

	2011	2010
ආරම්භක ශේෂය	154,469,646	173,752,661
වර්ෂය සඳහා ප්‍රතිපාදන	6,071,359	3,566,675
වර්ෂය තුළ කරන ලද ගෙවීම්	8,966,450	22,849,690
අවසාන ශේෂය	**151,574,555**	**154,469,646**

15. ජපන් රජයේ ප්‍රදාන

	2011	2010
ආරම්භක ශේෂය	109,213,811	116,490,680
වර්ෂය සඳහා ක්‍රමක්ෂය	(6,751,990)	(7,276,869)
අවසාන ශේෂය	102,461,821	109,213,811

16. රජයේ ප්‍රදාන

	2011	2010
ආරම්භක ශේෂය	248,767,202	236,406,383
එකතු කළා		
වර්ෂය තුළ ලැබීම්	77,570,400	100,000,000
වර්ෂය සඳහා ක්‍රමක්ෂය (ප්‍රදාන)	(81,834,726)	(86,175,572)
වර්ෂය සඳහා ක්‍රමක්ෂය (විලම්භිත වියදම්)	(1,856,800)	(1,463,609)
ශේෂය	242,646,076	248,767,202

17. මුල්‍ය කල්බදු

	2011	2010
මුල්‍ය කල්බදු (මෝටර් රථ)	27,666,386	1,086,668
වර්ෂය තුළ එකතු කිරීම්	43,950,060	33,652,560
	71,616,446	34,739,228
කල්බදු කුළිය	11,296,704	7,072,842
	60,319,742	27,666,386
අඩු කිරීම්		
කල්බදු පොලී අවිනිශ්චිත ගිණුම	9,762,226	6,498,605
	50,557,516	21,167,781
ජංගම වගකීම්	**10,722,324**	**4,496,426**
ජංගම නොවන වගකීම්	**39,835,192**	**16,671,355**

18. ණය හිමියෝ

	2011	2010
ගුවන් කාල විකුණුම්	84,419,798	123,252,859
ගුවන් කාල විකුණුම් - දේශිය (රජරට සේවය)	1,033,748	1,058,558
ගුවන් කාල විකුණුම් - දේශිය (රුහුණු සේවය)	11,884	341
ගුවන් කාල විකුණුම් - දේශිය (කඳුරට සේවය)	303,014	67,334
ගුවන් කාල විකුණුම් - දේශිය (කොත්මලේ)		118,854
	85,768,444	**124,497,945**

19. උපචිත අත්තිකාරම් හා විවිධ ණයහිමියෝ

	2011	2010
ජාතික ආරක්ෂක බදු	15,007,806	15,007,806
උපචිත වියදම්	81,743,830	72,875,501
සේවක අර්ථ සාධක අරමුදල	2,693,445	2,432,225
ජාතික ඉතුරුම් අරමුදල	(12,418)	(12,418)
නොගෙවූ වැටුප් හා වේතනා	490,014	549,546
උපයන විට ගෙවීම් - බදු	97,392	187,603
ණය හිමි පාලන ගිණුම		(259,552)
විවිධ ණය හිමියෝ	1,395,000	3,900,000
විවිධ ණය හිමියෝ (හිමිකම් නොපෑ චෙක්පත්)	10,000	
ජාතික ආරක්ෂක අරමුදල	2,835	2,835
රඳවාගැනීම් බදු	(30,106,015)	(27,074,350)
අලෙවි විධායක ආරක්ෂක තැන්පතු	160,704	138,427
එකතු කළ අගය මත බදු පාලන ගිණුම	27,717,437	28,390,268
බදු සඳහා ප්‍රතිපාදන (ආර්ථික සේවා ගාස්තු)	39,188,442	32,674,912
මානව ආපදා සහායක ගිණුම - සුනාමි	322,147	350,443
ජාතිය ගොඩගැනීමේ බදු	13,943,301	6,246,930
ඩොයිෂවෙල රේඩියෝ	16,337,306	51,025,565
යාල්දේවි දුම්රිය මාර්ගයේ ඉදිරිකිරීම්		2,557
	168,991,227	**186,438,298**

2011 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව

සභාපති,

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව.

<u>ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ 27 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලාංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2012 ජුලි 18 දින නිකුත් කරන ලදි.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය

විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට යොමුව	අනුකූල නොවීම
(අ) ප්‍රමිත අංක 18	ප්‍රමිතියට පටහැනිව කල්බදු පහසුකම් මත මිලදී ගත් වාහනවල වටිනාකම මත අයකරනු ලබන එකතු කළ අගය මත බද්ද රුː 4,536,904/- ක් පිරිවැය සඳහා ඇතුලත් කර ගිණුම් තැබීම නිසා වත්කම්වල වටිනාකම හා කල්බදු ණයහිමි වටිනාකම ඉහත වටිනාකමින් වැඩිවී තිබුණි.
(ආ) ප්‍රමිත අංක 36	2006 වසරේ සිට විශ්‍රාම ගිය නිලධාරීන් සඳහා ගෙවිය යුතු හිග පාරිතෝෂික මුදල රු. 11,756,859 ක් වූ නමුත්, 2011 දෙසැම්බර් 31 දිනට මෙම වගකීම සඳහා ගිණුම් ප්‍රමිතියට අනූව වෙන්කිරීමක් අවසන් ගිණුම තුළ දක්වා නොතිබුණි.

(ඇ) ප්‍රමිත අංක 5	ප්‍රධාන කාර්යාලයේ තොග ශේෂයේ ඇතුලත් රු. 545,800 ක් වූ සෙමින් චලනය වන තොග අයිතමයන් ගිණුම් ප්‍රමිතියට පටහැනිව අවසන් ගිණුම් වල 2011 දෙසැම්බර් 31 දිනට කැසට් හා සීඩී අවසන් තොග ශේෂය තුළ ඇතුලත්ව තිබුණි.

2.2.2. <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෙර වර්ෂයට හා පසු වර්ෂයට අදාලව ලැබී තිබූ පිළිවෙලින් රු.3,220,000/- ක් හා රු. 6,188,300 ක් වන ඇන්ටනා කුළුණු බදු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා එකතුව රු. 9,408,300/- කින් ලාභය වැඩියෙන් දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයට අදාලව 2010 හා 2012 වර්ෂවල ලැබී තිබූ රු. 8,808,300/- ක මුදලක් ආදායමට ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබූ රු.1,425,250 ක අධාර මුදලක් ආදායමක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට විවිධ වියදම් ගිණුමට බැර කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රමක්ෂය රු.12,056,089 කින් වැඩිපුර ගණනය කිරීම හේතුකොට ගෙන එම ප්‍රමාණයෙන් වෙනත් ආදායම් වැඩිපුරද ප්‍රාග්ධන ප්‍රදාන අඩුවෙන්ද ගිණුම්වල දක්වා තිබුණි. තවද කරගහතැන්න මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අදාල රු. 1,463,609/= ක ක්‍රමක්ෂය ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඈ) අඹේවෙල ඉඩම, සංස්ථා සේවකයින්ට වගා කටයුතු සඳහා ලබාදීමෙන්, 2012 වර්ෂය වෙනුවෙන් ලද රු. 1,050,000 ක් කලින් අදායම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ විවිධ ආදායම් ගිණුමට ඇතුලත් කර තිබුණි.

(ඉ) රු.3,836,035/- ක සැපයුම් අත්තිකාරම් හා එකතුව රු.1,472,547/- ක සැපයුම් අත්තිකාරම් පියවීම සේවක අත්තිකාරම් ගිණුම් යටතේ සටහන්ව තිබීම නිසා සැපයුම් අත්තිකාරම් ශේෂය රු.2,363,487/- කින් අඩුවෙන් ද සේවක අත්තිකාරම් ශේෂය එම ප්‍රමාණයකින් වැඩියෙන් ද දක්වා තිබුණි.

(ඊ) මෝටර් වාහන සඳහා වන එකතු කළ අගය මත බද්ද සහ සුඛෝපභෝගී මෝටර් වාහන සඳහා වන එකතු කළ අගය මත බද්ද අදාල ආයතනයට තම නිමවුම් බද්දට එරෙහිව අඩුකරගත නොහැකි නමුත් සංස්ථාව විසින් මිලදීගත් මෝටර් වාහන තුනක් සඳහා වන රු.2,074,671/- ක් වූ යෙදවුම් බද්දක් නිමවුම් බද්දට හිලවු කර තිබුණි.

(උ) ආදායමක් ලෙස 2010 වර්ෂයට අදාල රු.1,102,714/- ගුවන්කාල විකුණුම් ආදායමක් සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කර තිබුණි.

2.2.3 නොසැසඳු පාලන ගිණුම්

පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

(අ) ගිණුම් ශේෂයන් 11 කට අදාලව අවසන් ගිණුම් ශේෂයන් සමග උපලේඛනයන්හි රුඃ 36,825,724 ක ශේෂ අඩුවීමක්ද ගිණුම් විෂයයන් 02 කට අදාලව උපලේඛන අනුව රුඃ 7,074,790 ක ශේෂ වැඩි වීමක්ද නිරීක්ෂණය විය.

ගිණුම් සංඛ්‍යාව	ගිණුම් අනුව ශේෂ එකතුව	උපලේඛන අනුව ගිණුම් ශේෂ එකතුව	වෙනස
	රුඃ	රුඃ	රුඃ
10	47,964,616	11,138,892	36,825,724
03	10,422,788	17,497,578	(7,074,790)

(ආ) 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ගිණුම් වර්ෂවලදී ඉදිරිපත් කළ සේවක අත්තිකාරම් ගිණුම් හා ඒ සඳහා ලබා දුන් උපලේඛන අතර රුඃ 8,508,390 සිට 10,218,636 දක්වාවූ පරාසයක් තුළ වෙනස්කම් නිරීක්ෂණය වූ අතර, මෙම ශේෂයන් අතර වෙනස වර්ෂයෙන් වර්ෂයට වෙනස් වී තිබුණි.

2.2.4 අවිනිශ්චිත ගිණුම්

අවිනිශ්චිත ගිණුම් ශේෂ තුනක එකතු වටිනාකම රුඃ 6,216,325 ක් වන අතර ඒ තුළ අවුරුදු 21 ක කාලයක් තුළ හඳුනා නොගත් රුඃ 221,965 ක මුදල් ශේෂයක් ද තිබුණි. මේවා සියල්ල වංචා හේතුවෙන් පැනනගින ශේෂයන් බව සභාපතිවරයාගේ පිළිතුරෙන් පැහැදිලි වේ.

2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිර්දේශයට අනුව අදාල අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතියකින් තොරව රුඃ 28,466,498 ක ණයගැතියන් කපාහැර තිබුණි. ඉන් දේශීය ණය ශේෂය වන රුඃ 14,126,933 එක් එක් ණයගැති ශේෂයන්ට අදාලව ණයහිමි ශේෂය හඳුනාගෙන හිලව් කිරීම වෙනුවට මුළු එකතුවක් ලෙස ණයහිමි ශේෂයට හිලව් කර කපාහැර තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට ගුවන් කාල ණයගැති ශේෂය එකතුව රුඃ 168,681,587/- ක් වන අතර, ඉන් දේශීය (ප්‍රාදේශීය සේවා ණයගැතියන් හැර) හා විදේශීය ණයගැති ශේෂයන්ගේ එකතුව වන රුඃ 162,446,187 න් රුඃ 27,938,880 ක් වර්ෂ 5 ත් 10 ත් කාල පරාසය තුළ වන අතර රුඃ 40,543,639 ක් එනම් 25 % ක්ම වර්ෂ 10 ට වඩා පැරණි ශේෂ තිබුණි.

(ඇ) අලෙවි විධායකයකුගෙන් අයවිය යුතු රුඃ 7,495,430 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.6 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 02 කට අදාලව වටිනාකම රු: 10,398,636 ක ගණුදෙන හා ගිණුම් විෂයයන් 02 කට අදාලව රු: 3,078,360,981 ක් වටිනා වත්කම් විගණනය සඳහා උපලේඛන, වෙන්දේසි තොරතුරු සහ භෞතික සමීක්ෂණ වාර්තා නොමැතිකම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සමීක්ෂණය/සත්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) <u>පිළිතුරු නොදුන් විගණන විමසුම්</u>
සමාලෝචිත වර්ෂයට අදාළ විගණන විමසුම් 17 ක් සඳහා පිළිතුරු ලැබී නොතිබුණි. ඒ හා සම්බන්ධ ගණුදෙනුවල වටිනාකම රු: 3,164,623,589 ක් පමණ වේ.

2.2.7 <u>නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>

පහත සඳහන් නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව	අනුකූල නොවීම
(අ) පනත්වලට අනුකූල නොවීම	
(i) <u>1971 අංක 38 දරන මුදල් පනත 13 (2) වගන්තිය</u>	විගණනය වෙනුවෙන් දරන ලද වියදම් වලට අදාල ගාස්තුව සංස්ථාව විසින් විගණකාධිපතිට ගෙවිය යුතු වුවද 2005 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ගෙවිය යුතු රු: 3,039,362 විගණන ගාස්තු (බදු මුදල් සහිතව) 2012 ජූලි 31 දක්වාම ගෙවා නොතිබුණි.
(ii) <u>1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත</u>	2006 වසරේ සිට විශ්‍රාම ගිය නිලධාරීන් සඳහා ගෙවා ඇති පාරිතෝෂික මුදල ගණනයේදී වැටුප් හෝ වේතනය ලෙස මූලික වැටුප පමණක් ඇතුලත් කර තිබුණි.

(ඇ) හාණ්ඩාගාර චක්‍රලේඛ

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842	ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් පොදු 287 ආකෘතියට අනුව ස්ථාවර වත්කම් ලේඛනයක් හා පොදු 288 ආකෘතිය අනුව ස්ථාවර වත්කම් ලෙජරයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි

(i) මු.රෙ. 135	ආදායම් එකතු කිරීමේදී හා වියදම් දැරීමේදී නිලධාරීන් අතර මූල්‍ය බලතල පවරා නොතිබුණි.
(ii) මු.රෙ. 371 (2) (ආ)	අතුරු අග්‍රිමයක් වශයෙන් දෙන දීමනාව එක් අවස්ථාවකදී රුː20,000 ට නොවැඩි විය යුතු වුවත් එම සීමාවන් ඉක්මවා අවස්ථාවන් 168 කදී රුː 7,013,614 ක් දක්වා අත්තිකාරම් ලබා දී තිබුණි.
(iii) මු.රෙ. 371 (2)(ඇ)	මාණ්ඩලික තත්ත්වයේ නොවන නිලධාරීන් 16 ක් සඳහා ද රුː 3,424,174 ක් අත්තිකාරම් ලෙස ලබා දී තිබුණි. තවද දෙනලද කාර්යය නිමවූ වහාම නොපියවා එක් නිලධාරියකු අතෙහි කාල පරාසයේ උපරිමය වර්ෂයකට වඩා අධික කාලයක් දක්වා වටිනාකම උපරිමය ලෙස රුː 1,110,100 දක්වා විශාල මුදලක් නිලධාරීන් අතෙහි රැඳී තිබුණි.

2.2.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්ක දෙකට අයිති හෙක්ටයාර 13.57 ක ඉඩම් සඳහා බදු බලපත්‍රයක් ලැබී නොතිබියදී සංස්ථා සේවකයන් 13 දෙනෙකුට එයින් හෙක්ටයාර 8.1 ක් වර්ෂයකට රුː 2,000,000 කට බදු දී තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

සංස්ථාවේ සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රුː 36,414,877 ක බදු පූර්ව ලාභයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ලාභය රුː 38,020,868 ක් වූයෙන් බදු පූර්ව ලාභයෙහි රුː 1,605,991 ක අඩුවීමක් දක්නට ලැබුණි. ලාභය අඩුවීමට ප්‍රධාන වශයෙන් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන ලැබීම් රුː 35,000,000 කින් අඩුවීම හේතුවී තිබුණි.

4. මෙහයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනය සඳහා සංස්ථාවෙහි අංශ 21 කින් කාර්ය සාධන වාර්තාවන් ඉල්ලුම් කළ ද අංශ 14 කට අදාල අංශ 14 කට අදාල වාර්තාවන් පමණක් ලැබී ඇති අතර, එයින් පුහුණු අංශය හැර අනෙකුත් අංශවල කාර්යය සාධනයන් ක්‍රියාකාරි සැලැස්ම සමග සංසන්දනය කළ හැකි ආකාරයට සකස් කර නොතිබුණි.

(ආ) පුහුණු අංශය ක්‍රියාකාරී සැලැස්ම අනුව සිදුකිරීමට අපේක්ෂිත වු කාර්යයන් හා 2011 වර්ෂයේ කාර්ය සාධනය ලෙස ඉදිරිපත් කළ තොරතුරු හා සසඳා බැලීමේදී සත්‍ය වශයෙන් සිදුකළ කාර්යයන් ක්‍රියාකාරි සැලැස්මේ දක්වා ඇති කාර්යයන්ගෙන් වෙනස්ව තිබුණි.

(ඇ) ශ්‍රවණ පර්යේෂණ අංශයක් පවතින නමුත් එමගින් ශ්‍රවණ පර්යේෂණයන් සිදුකළ බවට වාර්තාවන් නොතිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාවට අයවිය යුතු රු. 4,614 සිට රු. 387,187 ක් දක්වා වටිනාකමින් යුත් ණයගැතියන්ගෙන් (වෙළඳ දැන්වීම් සඳහා) අයවිය යුතු රු. 2,149,202 ක් අයකර ගැනිමට රු.58,000 ක නිතීඥ ගාස්තු ගෙවා එන්තරවාසි යැවිමට කටයුතු කර තිබුණ ද, අලෙවි විධායක /සේවාදායකයන් හතර දෙනෙකුගෙන් අයවිය යුතුව තිබු වර්ෂ 2005 සිට 2009 දක්වා සිට පැවත එන එකතුව රු.6,582,208 ක් වු ණය සම්බන්ධයෙන් නිතීමය කටයුතු කිරිමට ක්‍රියා කර නොතිබුණි.

(ආ) 2009, 2010 හා 2011 වර්ෂවල මිලදී ගෙන ප්‍රධාන ගබඩාවෙන් ඒ ඒ අංශ වලට නිකුත් කරන ලද භාණ්ඩ කිසිවක් 2011 සමික්ෂණ වාර්තාවට ඇතුලත් වී නොමැති බව නිරික්ෂණය විය. ඒ අනුව භෞතික පරික්ෂාව නිවැරදිව සිදුකර නොමැති බව හෝ 2009, 2010, 2011 වර්ෂ වලදි නිකුත් කළ භාණ්ඩ එම අංශවල භෞතිකව නොතිබු බව හැගි යයි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ වර්ග 177 ක් සම්බන්ධයෙන් කමිටු නිලධාරින් විසින් 2011 මැයි 20 දින විකිණිමට අවම අගය රු. 98,000 කට නිර්දේශ කර තිබුණු අතර, පසුව අමතර අබලි යකඩ තොගයක් ද ඇතුළුව මෙම භාණ්ඩ රු.22,500 කට නැවත අඩුවෙන් තක්සේරු කර අලෙවියෙන් රු. 180,000 ක් ලැබී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලින් පෙන්වා දී තිබූ පරිදි ප්‍රධාන කාර්යාලයේ එක් එක් අංශවල හා ප්‍රාදේශිය සේවා හා කාර්යාලවල වට්ටෝරු භාණ්ඩ පොත් පවත්වාගෙන නොයාම, යාවත්කාලීනව පවත්වාගෙන නොයාම, පොත් තුලනය නොකිරීම, ලේඛන යාවත්කාලීන කිරීම හා නඩත්තු කිරීම පිළිබඳ වූ අකාර්යක්ෂමතාව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

ඒකල විකාශනාගාරය භූමිය තුල පිහිටි අක්කර 1 1/2 ක ප්‍රදේශයක පොල් වගාව නිසි ලෙස නඩත්තු නොකිරීම හේතුවෙන් අඩු ඵලදාවක් ලැබී තිබුණි. තවද අක්කර 18 ක පමණ භූමි ප්‍රමාණයක් නිෂ්කාර්යව පැවතුණි.

4.5 ආර්ථික නොවූ ගණුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1993 වර්ෂයේදී සීමාසහිත ලංකා පුවත් ආයතනයේ ආයෝජනය කර ඇති රුපියල් ලක්ෂ 10 ක මුදලට කිසිදු ආයෝජන ආදායමක් ලැබී නැති අතර, ආයෝජන මුදල හෝ ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සංස්ථාව නමින් මිලදී ගෙන පසුව කල්බදු පහසුකම් ලබාගැනිම සඳහා 2009 වර්ෂයේදි මිලදී ගත් මෝටර් රථයට අනෙක් රථ දෙකට වඩා රු. 181,269 ක් වැඩියෙන් කල්බදු සඳහා 2011 දි වැය දැරීමට සිදුවී තිබුණි.

4.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මධ්‍ය වායු සමීකරණ පද්ධතියක් ගෙනවිත් සවිකිරිම සඳහා වූ ව්‍යාපෘතිය රු. 13,229,943 කට කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කිරීමෙන් තොරව ආයතනයකට පවරා අවස්ථා 04 කදි රු. 8,600,000 ක මුදලක් ද ගෙවා තිබුණි. පසුව 2010 නොවැම්බර් 18 දින කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර පළමු අත්තිකාරම් මුදල ගෙවූ දින සිට දින 375 ක් ඇතුලත වැඩය නිම කළයුතු බව දක්වා තිබූ නමුත්, 2012 ජූලි මස 12 දින වන විටද එය නිමකොට භාරදි නොතිබුණු නමුත් දින දීර්ඝ කර ගැනිමට කටයුතු ද කර නොතිබුණි. 2011 අවසන්වන විට එකතුව රු.10,300,000 ක් ගෙවා තිබූ නමුත් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද වන්දි අයකරගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8.(අ) වගන්තිය අනුව කාර්යසාධන සුරක්ෂණය වැඩ නිම කිරිමට අපේක්ෂිත දිනයෙන් පසුව දින 28 ක් දක්වා වලංගු විය යුතු වුවද, මෙම කාර්යය සඳහා දින 60 කට පමණක් සුරක්ෂණයක් ලබාගෙන තිබූ අතර, කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කරන විටද සුරක්ෂණයෙහි කාලය ඉක්ම ගොස් තිබුණි. සුරක්ෂණයේ දින දිර්ඝ කර ගැනිමට ද කටයුතු කර නොතිබුණ අතර, ඒ පිළිබඳව වගන්තියක් කොන්ත්‍රාත් ගිවිසුමටද ඇතුලත් කර නොතිබුණි.

4.7 <u>වෙනත් රාජ්‍ය අයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්</u>

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

ඒකල විකාශනාගාරය පිහිටා ඇති ඉඩමෙහි අක්කර 12 ක පමණ භූමි භාගයක සංස්ථාවට අයත් නොවන බැකෝ යන්ත්‍ර සූත්‍ර විශාල ප්‍රමාණයක් ද නවතා තිබුණි. ඊට අමතරව ජලය හා විදුලිය ද බාහිර පුද්ගලයින් විසින් භාවිතා කරනු ලබන අතර, ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.8 <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ මුල්‍ය හා පරිපාලන කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමට පළපුරුදු නිළධාරින්ගේ සේවය සංස්ථාවට අත්‍යවශ්‍ය වුවද නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන/මුල්‍ය) තනතුර 2008 දෙසැම්බර් 01 වන දින සිට පුරප්පාඩුව පවතින අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) තනතුර ද 2008 ජුලි 09 දින සිට පුරප්පාඩුව තිබුණි. මින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) සඳහා පමණක් 2012 ජුලි 06 දින සිට වර්ෂයක් සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇත.

(ආ) 2005 ජූනි 16 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක අමප05/විවිධ/026, හා ආයතන සංග්‍රහයේ II කොටසේ 9 වන පරිච්ඡේදයට පටහැනිව 2011 වර්ෂයේදී පැවරුම් පදනම මත නිලධාරින් 21 දෙනෙකුට පත්වීම් ලබාදී ඇති අතර, ඉන් 16 ක් සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2007 (1) චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව නිශ්චිත රාජකාරි පුරප්පාඩුවක් නොමැතිව පත්කිරීම් සිදුකර තිබුණි. කොන්ත්‍රාත් පදනම මත ද නිලධාරින් 34 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබූ අතර, එම කොන්ත්‍රාත් තනතුර ද අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇතුලත් නොවේ. මෙසේ 2011 වර්ෂයේදී පැවරුම් පදනම මත බඳවාගත් නිලධාරින් සඳහා රු. 5,299,500 ක් ද කොත්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් සඳහා රු. 3,367,392 ක් ගෙවා තිබුණි.

(ඇ) 2011 ජුලි 05 දින සිට මාසයක කාලයක් සඳහා කාර්ය මණ්ඩල ප්‍රතිශෝධනය යළි සමාලෝචනයට, මුල්‍ය විනයක් ඇති කිරීමට හා ආදායම් වැඩිදියුණු කිරීමට අදාල නිර්දේශ ඉදිරිපත් කිරීම සහ සංස්ථා පරිපාලනය විධිමත් කිරීමට අදාළ නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම යන කාර්යයන් 03 සඳහා රු. 50,000 ක දීමනාවක් මත මාස 01 ක් සඳහා පත්කරන ලද නිලධාරියකු එම කාර්යයන් ඉටු කිරීම සඳහා මාස 03 ක කාලයක් සඳහා පත්වීම දීර්ඝ කර රු. 200,000 ක මුදලක් ලබාගෙන ඇති නමුත් ඉටුකර ඇත්තේ සේවක මණ්ඩල සංයුතිය පිළියෙල කිරීම පමණක් වන අතර එයද අසම්පූර්ණව තිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ xii පරිච්ඡේදයේ 22 වගන්තියට පටහැණිව නිලධාරීන් දෙදෙනෙකු විසින් අසීමිත ලෙස වැටුප් රහිත නිවාඩු ලබාගැනීම සහ නොදන්වා සේවයට වාර්තා නොකිරීම් සිදුකර තිබුණ ද ඒ පිළිබඳව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) උපකරණ නඩත්තු සහායිකා ලෙස බඳවාගත් නිලධාරිනියන් සඳහා පුහුණුවන කාර්මික සහකාර තනතුර ලබාදීම පිළිබඳව ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය හා සංස්ථා මණ්ඩල තීරණය ක්‍රියාත්මක නොකිරීම මත ඔවුන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොණුකර තිබූ අතර, පසුව සමතයකට පත්වී එම තනතුරු ලබාදී තිබුණි. මේ සඳහා නීතිඥ ගාස්තු ලෙස රු. 309,904 ක් ගෙවීමට සිදුවී තිබුණි.

4.9 **වාහන උපයෝජනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ධාවන තත්ත්වයේ පවතින වාහන 04 ක් සම්බන්ධයෙන් 2004 අගෝස්තු 31 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 353 (5) ඡේදය අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ධාවන සටහන් අපැහැදිලිව හා අවශ්‍ය සටහන් යෙදීමකින් තොරව පැවති අතර, මයිලෝමීටරය ධාවන සටහන් සමග එකග නොවීමද, දිනය අවසානයේ ඉතිරි ඉන්ධන ඉදිරියට ගෙන යැමේදි අඩුවෙන් සටහන් කිරීම් ද ධාවනය කළ කිලෝමීටර් ප්‍රමාණය ගමන් විස්තරය අනුව දුර සමග අසාමාන්‍ය වෙනස්වීම් ද වූ අතර, ඒ අනුව ධාවන සටහන් වගකීමෙන් තොරව සටහන් තබන බව නිරීක්ෂණය විය.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පිඊඩී 12 දරන ව්‍යාපර චක්‍රලේඛයේ 6.5.1. වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත අවසන් ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු නමුත් ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබුවේ දින 110 කට පසුව එනම් 2012 අප්‍රේල් 20 දින දීය.

5.1 සංයුක්ත සැලැස්ම

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන ව්‍යාපාර චක්‍රලේඛයේ ප්‍රකාරව සංයුක්ත සැලැස්ම තුළ අඩංගු වියයුතු කරුණු අතරින් සංස්ථාව සතුව දැනට පවතින සම්පත් පිළිබඳ සටහන, සංවිධාන ව්‍යුහය, සංස්ථාව සතු ශක්තීන් හා දුර්වලතා අවස්ථා හා තර්ජන (ශදුඅත) පිළිබඳ විශ්ලේෂණය, පසුගිය වසර 03 ක මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ විමර්ශනය, කාර්ය මණ්ඩල විස්තර යන කරුණු 2011-2014 වර්ෂ සඳහා පිළියෙල කළ සංයුක්ත සැලැස්ම තුළ ඇතුලත් කර නොතිබුණි. එම සංයුක්ත සැලැස්ම 2012 මැයි 15 දින වන විටත් අනුමත කර නොතිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 5.1.3. වගන්තියේ සහ 2007 දෙසැම්බර් 18 දිනැති පිඊඩී 47 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්ම හා අයවැය ලේඛනයේ මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට හා භාණ්ඩාගාරයට ඉදිරිපත් කළයුතු වුවත්, ඉදිරිපත් කර නොතිබුණි.

5.2 <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

(අ) පැහැදිලිව හඳුනාගත හැකි වන පරිදි ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර ඇති කාර්යයන් සඳහා වගකීම් දරන නිලධාරීන් හඳුනාගෙන නොතිබුණි.

(ආ) ක්‍රියාකාරි සැලැස්ම තුළ සිදුකිරිමට අපේක්ෂිත කාර්යයන් සඳහා අවශ්‍ය සම්පත් (මුල්‍යමය හා මුල්‍යමය නොවන) ප්‍රමාණය දැක්විය යුතු වුවද එසේ දක්වා නොමැත.

5.3 <u>අභ්‍යන්තර විගණනය</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණක තනතුර සඳහා බඳවාගෙන තිබූ නිලධාරියා ඔහුට අදාල නොවන වෙනත් තනතුරකට පත්කොට තිබුණි. පුරප්පාඩු වු අභ්‍යන්තර විගණක තනතුර සඳහා වැඩ බලන අභ්‍යන්තර විගණක ලෙස විමර්ශන නිලධාරී පත්කර තිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලයේ විගණන සහායක තනතුරු 04 ක් පැවතිය ද, එක් ස්ථිර විගණන සහායකයෙක් පමණක් සේවයේ යෙදී සිටී. තවද පුහුණු වන්නන් දෙදෙනෙක් සිටින අතර, එමගින් අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන් ගුණාත්මකව කල නොහැකිව තිබුණි.

(ඇ) විගණන ප්‍රමිත 610 හා 2009 ජුනි 09 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ ඩීඑම්ජ්/2009 (1) මා මු.රෙ. 133 ට අනුව අභ්‍යන්තර පාලනයන් ඇගයීමට අභ්‍යන්තර විගණනය කටයුතු කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද අභ්‍යන්තර විගණන විමසුම් වලින් පෙන්වා ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (5)(ඩී) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළයුතු අර්ධ වාර්ෂික වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි.

5.4 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඒඩී 12 දරන ව්‍යාපර චක්‍රලේඛයේ 7.4.1. අනුව කමිටුවේ අවම වශයෙන් විධායක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන්වත් සමන්විත විය යුතු වුවද, පැවරුම් පදනම මත සංස්ථාවේ සේවයේ යෙදී සිටින අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සහභාගි වී තිබුණි.

(ආ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 හි කාර්යයන් 09 ක් විගණන හා කළමනාකරණ කමිටුවෙහි විෂය පථය ලෙස සඳහන් වුවද, එයින් කාර්යයන් 06 ක් ම සංස්ථාවෙහි විගණන හා කළමනාකරණ කමිටුව මගින් ඉටුකර නොතිබුණි.

(ඇ) කමිටුවෙහි නිරික්ෂණ ඇතුලත් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළයුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

6. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයේ අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම් ලේඛන පවත්වාගෙන යාම.

(ආ) මුදල් වත්කම් අනාරක්ෂිතව පවත්වාගෙන යාම.

(ඇ) ආදායම් පරිපාලනය.

(ඈ) ගිණුම්කරණය.

(ඉ) පොත් තැබීම.

(ඊ) කාර්ය මණ්ඩල.

(උ) අභ්‍යන්තර විගණනය.

අත්සන් කළේ,

එස්. ඒ. එස්. සමරවීර,

විගණකාධිපති.

2011 විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාවේ පරිකථනය

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ ප්‍රමිත අංක 18

ප්‍රමිත අංක 36

ප්‍රමිත අංක 05 2012 වර්ෂයේ අන්තර් ජාතික ප්‍රමිතිය අනුව ගිණුම් සකස් කරන විට නිවැරදි වේ.

2.2.2. ගිණුම්කරණ අඩුපාඩු

(අ) ඇන්ටනා කුළුණු බදු ආදායම ගිණුම්ගත කිරීම. නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

(ආ) බෝධිසරය සෑදීම සඳහා ලැබූ ආධාර මුදල් එම කාර්යය සඳහාම වැය කළයුතු වූ නිසා මෙලෙස ගිණුම්ගත කර ඇත. ආධාර මුදලට වැඩියෙන් වියදම් වූ මුදල් ද, සංස්ථාවෙන් දරා ඇත.

(ඇ) වෙනත් ආදායම්, ප්‍රාග්ධන ප්‍රධාන ක්‍රමක්ෂය අත්හැරීම ආදි ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

(ඈ) අඹේවෙල ඉඩම සංස්ථා සේවකයින් සඳහා බදු ලබාදී ඇත්තේ 2011 වර්ෂයේදීය. මෙම මුදල් ලැබුණු අවස්ථාවේදීම ආදායම් ගිණුමට ගිණුම්ගත කර ඇත.

(ඉ) සැපයුම් අත්තිකාරම් ගිණුම හා සේවක අත්තිකාරම් ගිණුම අතර සටහන් නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

(ඊ) මෝටර් වාහන සඳහා වන යෙදවුම් බද්දක් නිමවුම් බද්දට හිලව් කිරීම නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

(උ) ගුවන් කාල ආදායම් ගිණුම්ගත කිරීමේදී 2010 වර්ෂයේ සිදුවූ වරදක් 2011 වර්ෂයේදී නිවැරදි කිරීම සිදුකර ඇත.

2.2.3 නොසැසඳුන පාලන ගිණුම්

(අ)(ආ) 2012 වර්ෂයේ නව ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව ගිණුම් සකස් කිරීමේදි පාලන ගිණුම් නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

2.2.4 අවිනිශ්චිත ගිණුම්

අවිනිශ්චිත ගිණුම් ඇති වීමට මුදල් වංචාවක් හේතු වී ඇත. මේ සඳහා නීති කටයුතු කරමින් ඇත.

2.2.5

(අ) ණයගැතියන් සහ ණයහිමියන් හිලව් කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලැබී ඇත.

(ආ) මෙම ණයගැති ශේෂයන් එම වර්ෂවල විකුණුම් ආදායම් හා සලකා බැලීමේදී ඉතා අඩු ප්‍රතිශතයකි. එම ශේෂයන් ද, අයකර ගැනීම සඳහා කටයුතු කරන අතර අයකර ගත නොහැකි ශේෂ කපා හැරීමට කටයුතු යොදා ඇත.

(ඇ) අලෙවි විධායකයාගෙන් අයකරගත යුතු මුදල් සඳහා නීති මගින් කටයුතු කර ඇත.

2.2.6

(අ) වත්කම් සහ වෙන්දේසි සම්බන්ධයෙන් සංස්ථාව සතු සියළුම තොරතුරු විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත.

(ආ) 2011 වර්ෂයේ විගණන විමසුම් 17 ක් යොමුකර ඇති අතර, 2012-07-04 වන විට එම වර්ෂයන්ට අදාල විගණන විමසුම් සඳහා පිලිතුරු ලබා දී ඇත.

2.2.7 පනත්වලට අනුකූල නොවීම

භාණ්ඩාගාර චක්‍රලේඛ 1970-12-19 අංක 842 මුදල් රෙගුලාසිය

(අ) i විගණනය වෙනුවෙන් විගණකාධිපතිට ගෙවිය යුතු මුදල්, කොටස් වශයෙන් ගෙවීමට කටයුතු යොදා ඇත.

ii 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව 2006 සිට හිඟ පාරිතෝෂික මුදල් ගෙවීම සිදුකරයි.

(ආ) පොදු 287 ආකෘතියට අනුව ස්ථාවර වත්කම් ලේඛනය සකස් කර ඇත.

(අ) i මු.රෙ. 135 අනුව මූල්‍ය බලතල පැවරීමේ කාර්යය සිදු කිරීමට කටයුතු යොදා ඇත.

ii සංස්ථාවේ වැඩ කටයුතු පැය 24 පුරාම අඛණ්ඩව පවතී. එම නිසා මෙම කාර්යය ස්වභාවය මත දීමනාව රු. 20,000/- සීමා කිරීමට නොහැකි අවස්ථා ඇතිවී ඇත.

iii රාජකාරි අවශ්‍යතාව මත මාණ්ඩලික නොවන තත්ත්වයේ නිලධාරීන්ට අත්තිකාරම් මුදල් ලබාදී ඇත. එම රාජකාරි නිමවූ වහාම අත්තිකාරම් පියවන ලෙස උපදෙස් දී ඇත.

2.2.8 අඹේවෙල පිහිටි නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්ක වලට අයිති ඉඩම විකාශන කටයුතු සඳහා සංස්ථාව භුක්ති විඳිමින් සිටින අතර, මධ්‍යම තරංග විකාශනාගාර කටයුතු අවසන් කලද, ඉදිරියේදී නවීන තාක්ෂණය අනුව විකාශන මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත කිරීමට නියමිතය.

03. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

04. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) නව සංයුක්ත සැලැස්ම සමග වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස්වන අතර කාර්ය සාධනය ඇගයීම, ඒ අනුව සිදුකරනු ඇත.

(ආ) ආයතනයේ අවශ්‍යතා මත පුහුණු සැලැස්ම ක්‍රියාත්මක කර ඇත.

(ඇ) ශ්‍රවණ පර්යේෂණ අංශය ප්‍රාදේශීය සේවා හා සම්බන්ධ වී 2013 සඳහා දීපව්‍යාප්ත ශ්‍රවණ පර්යේෂණයක් සිදුකරයි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) ණය අයකර ගැනීමේ උපක්‍රමයක් ලෙස ණය ගැතියන්ට එන්තරවාසි යවා ඇත.

(ආ) ප්‍රධාන ගබඩාව විසින් සකස් කරන ලබන ප්‍රධාන ඉන්වෙන්ට්‍රිය අනුව නෛතික පරික්ෂා කිරීමට කටයුතු යොදා ඇත.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ වර්ග 177 ඒ පිළිබඳ කර තිබූ තක්සේරුව සම්බන්ධයෙන් සෑහීමට පත්විය නොහැකි වූ නිසා නැවත තක්සේරු කරන ලදි.

(ආ) භාණ්ඩ සමීක්ෂණ වාර්තා වලින් පෙන්වා දී ඇති පරිදි සියලුම අංශවල ප්‍රාදේශීය සේවාවල හා කාර්යාලවල වට්ටෝරු භාණ්ඩ පොත් නිසි පරිදි පවත්වාගෙන යනු ලබයි.

4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

ඒකළ විකාශනාගාර භූමිය තුළ පොල් වගා කිරීම සඳහා සේවකයින් යොදවා නැත. විකාශන කටයුතු සඳහා යොදවා ඇති සේවකයින් යොදවා වගා කටයුතු කිරීමේදී අපහසුතා ඇතිවේ.

4.5 ආර්ථික නොවූ ගණුදෙනු

(අ) 1993 වර්ෂයේදි සී/ස ලංකා පුවත් ආයතනයේ ආයෝජනය සම්බන්ධයෙන් එම ආයතනය හා සාකච්ඡා කර තීරණයක් ගැනීමට නියමිතය.

(ආ) හදිසි වාහන අවශ්‍යතාව නිසා සංස්ථාව නමින් මිළදී ගත්තද, පසුව කල්බදු පහසුකම් ලබාගැනීමේදී දැරීමට සිදුවන වියදම නිසා මෙම වියදම් වැඩිවීම සිදුවිය.

4.6

(අ) මධ්‍යම වායු සමීකරණ පද්ධතිය සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර ඇත. 2012-11-12 දින වන විටත් රු. මිලියන 2.9 ක මුදලක් රඳවාගෙන ඇත.

(ආ) ගුවන් විදුලි සංස්ථාවේ මැදිරි නිදහස් කිරීමේදී ඇති වු අපහසුතා නිසා නියමිත කාලය තුළ මෙම වැඩ නිම කිරීම සඳහා හැකියාව ලැබුනේ නැත.

4.7 වෙනත් ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

ඒකළ විකාශනාගාරය පිහිටා ඇති ඉඩමෙහි ජාතික අවශ්‍යතාවය මත පහත සඳහන් යුධ හමුදා අනුබණ්ඩ ස්ථාපිත කර ඇත.

පොදු සේවා බලකාය - වගා කටයුතු සඳහා

ඉංජිනේරු බලකාය - ගම්පහ දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සඳහා

ආරක්ෂක බලකාය - විකාශනාගාරයේ ආරක්ෂාව සඳහා

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) නි.අ.ජ.(මුදල්), නි.අ.ජ.(ඉංජිනේරු) තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු යොදා ඇත.

(ආ) වර්තමානයේ සංස්ථාවේ අවශ්‍යතා මත නිලධාරීන් 14 ක් කාර්ය පැවරුම් පදනම මත සේවයේ යොදවා ඇති අතර, ඔවුන් සඳහා කාර්යයන් පවරා ඇත.

සේවා අවශ්‍යතාවය මත කොන්ත්‍රාත් පදනමේ නිලධාරීන් 79 ක් සේවයේ යොදවා ඇත. මොවුන් සඳහා නිත්‍ය රාජකාරි පවරා ඇත.

(ඇ) ගාමිණී කාරියවසම් මහතා

ගාමිණී කාරියවසම් මහතා විශ්‍රාම ලත් පරිපාලන නිලධාරියෙකි. 2011 නොවැම්බර් සිට ඒ මහතාගේ සේවය නවත්වා ඇත.

(ඈ) මෙම නිලධාරීන් විසින් ලබාගත් වැටුප් රහිත නිවාඩු සඳහා ඔවුන්ට වැටුප් ගෙවීම හා වැටුප් වර්ධක ගෙවීම නවතන ලදි.

(ඉ) උපකරණ නඩත්තු සහායිකාවන් විසින් කාර්මික සහකාර තනතුර ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කිරීම නිසා නීතිඥ ගාස්තු ගෙවීමට සිදුවිය.

4.9. වාහන උපයෝජනය

(අ) ධාවන තත්ත්වයේ නොපවතින 60 ශ්‍රී 355 වොක්ස් වැගන් වෑන් රථය රු. 150,000/- ට තක්සේරු කර ඇත. ටෙන්ඩර් කැඳවා විකිණීමට කටයුතු යොදා ඇත.

මෝටර් බයිසිකල් 03 සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුව අදාල කටයුතු කර ඇත.

(ආ) ප්‍රවාහන අංශයේ ධාවන සටහන් හා මයිලෝ මීටරය සම නොවීම හා ඉතිරි ඉන්ධන සම්බන්ධයෙන් අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකර ඇත.

05. ගිණුම් කටයුතුභාවය යහ පාලනය

5.1 (අ) **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත ගිණුම් සකස් කර අවසන් වී තිබුණ ද, මේ සඳහා සංස්ථා මණ්ඩල අනුමැතිය ලැබී තිබුණේ 2012-04-05 දිනදීය.

5.1 **සංයුක්ත සැලැස්ම**

(අ) 2012 - 2014 වර්ෂ සඳහා නව සංයුක්ත සැලැස්මක් සකස් කර සංස්ථා මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. මේ වන විට සංයුක්ත සැලැස්ම අමාත්‍යාංශ ලේකම් වරයා වෙත ඉදිරිපත් කර ඇත.

(ආ) මේ දක්වා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට හා භාණ්ඩාගාරයට මෙම ලේඛන යැවීමට කටයුතු කර ඇත.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

(අ), (ආ) 2013 වර්ෂයේ සකස් කර ඇති ක්‍රියාකාරී සැලැස්ම මෙම අඩුපාඩු අවම වනසේ සකස් කර ඇත.

5.3 අභ්‍යන්තර විගණනය

(අ) අභ්‍යන්තර විගණනය ලෙස නිත්‍ය තනතුර දරණ නිලධාරියා නැවත අදාල රාජකාරිවල නියුක්ත කිරීමට කටයුතු යොදා ඇත.

(ආ) අභ්‍යන්තර විගණන අංශය සඳහා කොන්ත්‍රාත් පදනමින් විගණන සහායකයින් දෙදෙනෙකු පත්කර ඇත.

(ඇ) අභ්‍යන්තර විගණන අංශය මගින් අභ්‍යන්තර පාලනය ඇගයීමේ කටයුතු සිදුකරන අතර, අභ්‍යන්තර විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇත.

(ඈ) ඉදිරිපත් කළ යුතු අර්ධ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරනු ලැබේ.

5.4 විගනන හා කළමනාකරණ කමිටු

(අ) විගණන හා කළමනාකරණ කමිටුවෙහි අවම වශයෙන් විධායක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද, පැවරුම් පදනම මත සේවය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙක් ද, මේ දක්වා මෙම කමිටුව නියෝජනය කරන ලදි. වර්තමාණය වන විට මෙය නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ආ) සංස්ථාවේ සියලුම අංශ නියෝජනය වන ලෙස විගණන හා කළමනාකරණ කමිටුව මගින් කාර්යයන් ඉටුකර ඇත.

(ඇ) විගණන හා කළමනාකරණ කමිටු වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි.

06. පද්ධති හා පාලනයන්

(අ) ස්ථාවර වත්කම් ලේඛන පවත්වාගෙන යාම

(ආ) මුදල් හා වත්කම් අනාරක්ෂිතව පවත්වාගෙන යාම

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) ගිණුම්කරණය

(ඉ) පොත් තැබීම

(ඊ) කාර්ය මණ්ඩල

(උ) අභ්‍යන්තර විගණනය ආදි අංශ සඳහා විශේෂ අවධානය යොමු කර කටයුතු කරනු ලබයි.